කාර්ය සාධන වාර්තාව

2020



යාපහුව

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

2020 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය :- 207

පරිච්ඡේදය 01 -	ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය	.....	01 - 09
පරිච්ඡේදය 02 -	ප්‍රගතිය හා ඉදිරි දැක්ම		
2.1	විශේෂ ජයග්‍රහන, අභියෝග සහ ඉදිරි ඉලක්ක	.....	10 - 19
2.2	කාර්යසාධනය වර්ධනය කර ගැනීම සඳහා අනුගමනය කිරීමට අපේක්ෂිත කෙටිකාලීන හා මධ්‍යකාලීන ක්‍රියාමාර්ග	.....	20 - 23
පරිච්ඡේදය 03 -	වසරේ සමස්ත මුල්‍ය කාර්ය සාධනය		
3.1 – 3.9	මූල්‍ය තත්තවය පිළිබඳ ප්‍රකාශ	.....	24 - 29
3.10	මුල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණන වාර්තාව	.....	30 - 48
පරිච්ඡේදය 04 -	කාර්ය සාධන දර්ශකය	.....	49
පරිච්ඡේදය 05 -	තිරසර සංවර්ධන (SDG) අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය	.....	50 - 53
පරිච්ඡේදය 06 -	මානව සම්පත් පැතිකඩ	.....	54 - 55
පරිච්ඡේදය 07 -	අනුකූලතා වාර්තාව	.....	56 - 62

01.පරිච්ඡේදය

ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම.

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය ආරක්ෂා කිරීම සඳහා 1940 අංක 9 දරන පුරාවස්තු ආඥා පනතින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ඇත. ශ්‍රී ලංකාවේ පැරණිතම දෙපාර්තමේන්තුවක් වන මෙම දෙපාර්තමේන්තුවට 2020 වර්ෂයේ ජූලි මාසයේ දී වර්ෂ 130 ක් පූර්ණ වූ අතර, 1998 අංක 24 දරන පුරාවස්තු (සංශෝධන) පනතට අනුව දෙපාර්තමේන්තුවේ වත්මන් කටයුතු සිදු කරණු ලබයි. එවකට නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ විෂය පථය යටතේ තිබූ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව 2019.12.10 දිනැති අංක 2153/12 දරන ගැසට් පත්‍රයට අනුව බුද්ධශාසන, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය යටතට ද, 2020.08.09 දිනැති අංක 2187/27 දරන ගැසට් පත්‍රයට අනුව ආරක්ෂක අමාත්‍යාංශය යටතට සහ 2020.11.20 දිනැති අංක 2202/25 දරන ගැසට් පත්‍රයට අනුව ජාතික උරුම, ප්‍රාසාංග කලා සහ ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය යටතට ද පැවරුණි.

දෙපාර්තමේන්තුවේ ආයතනික කටයුතු භාණ්ඩාගාර ප්‍රතිපාදන හා පොදුනැන්පත් ගිණුම යටතේ ඇති මුල්‍ය ප්‍රතිපාදන යටතේ සිදු කෙරේ. 2020 වර්ෂය සඳහා අතුරු සම්මත ගිණුම් හතරක් යටතේ භාණ්ඩාගාර මුල්‍ය ප්‍රතිපාදන දෙපාර්තමේන්තුවට ලැබුණි. ඒ අනුව පුනරාවර්තන වියදම් ලෙස රුපියල් මිලියන 1,049.212 ක් සහ මූලධන වියදම් ලෙස රුපියල් මිලියන 154.246 ක් ඇතුළත්ව 2020 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවට වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 1.203.458 කි.

2020 වසරේ භාණ්ඩාගාර මුල්‍ය ප්‍රතිපාදන යටතේ පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක ගවේෂණ සහ ලේඛනගත කිරීම්, කැණීම්, අභිලේඛන හා නාණක විද්‍යා කටයුතු / පර්යේෂණ, පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක සංරක්ෂණය සහ නඩත්තු කිරීම, පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක ප්‍රවර්ධනය සහ මහජන ප්‍රදර්ශන කටයුතු හා වසර ගණනාවක සිට අඛණ්ඩව ක්‍රියාත්මක වන විශේෂ ව්‍යාපෘති වූ රජගලතැන්න පුරාවිද්‍යා ස්ථානය සහ රිටිගල පුරාවිද්‍යා ස්ථානය සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘති ඇතුළත්ව පළාත් සහ දිස්ත්‍රික්ක මට්ටමින් ව්‍යාපෘති 400 කට අධික ප්‍රමාණයක් ක්‍රියාත්මක විය. කන්නියා උණුවතුර ළිං පරිශ්‍රය නඩත්තු කර පවත්වා ගෙනයාම ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අධීක්ෂණය යටතේ සිදුවන අතර, ඒ සඳහා අවශ්‍ය මුල්‍ය ප්‍රතිපාදන දෙපාර්තමේන්තුව මඟින් ලබා දෙන ලදි.

2020 වසර සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදල් ප්‍රතිපාදන යටතේ මුල්‍ය ප්‍රතිපාදන නොලබුණු බැවින්, 2020 වර්ෂය තුළ මධ්‍යම සංස්කෘතික අරමුදල් ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීය. 2020 වර්ෂය සඳහා බාහිර ආයතන ආධාර මඟින් ලබාදී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 39.557 ක් වූ අතර, දිස්ත්‍රික්ක මට්ටමින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති සංඛ්‍යාව 45ක් විය.

2020 වර්ෂයේ පැවති Covid – 19 ගෝලීය වසන්ගත තත්ත්වය හමුවේ වුවද, වසර තුළ දෙපාර්තමේන්තුවට ලැබූ මුල්‍ය ප්‍රතිපාදනයන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස උපයෝජනය කරමින් දෙපාර්තමේන්තුවේ ශාස්ත්‍රීය අංශයන් ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් කාර්යාල සමඟ සම්බන්ධීකරණය වෙමින් "ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය මනා ලෙස කළමනාකරණය කිරීමේ" මෙහෙවර ඉටුකිරීමෙහිලා 2020 වර්ෂයේ

සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල ප්‍රගතිය සැලකියුතු මට්ටමක පවත්වා ගැනීමට දෙපාර්තමේන්තුවට හැකි විය.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

- **දැක්ම**

  සමස්ත පුරාවිද්‍යාත්මක උරුමය මනාලෙස කළමනාකරණය කර මතු පරපුරට දායාද කිරීම.

- **මෙහෙවර**

  ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය කළමනාකරණයේ වගකීම දරන උපරිම ආයතනය සහ එහි ප්‍රධාන නියාමක ආයතනය ලෙස කටයුතු කිරීම.

- **අරමුණු**

  ඉහත මෙහෙවර ඉෂ්ට කර ගැනීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අරමුණු කිහිපයකි.

01. සම්පත් ප්‍රවර්ධනය
    i). මානව
    ii). ආයතනික
02. සමස්ත පුරාවිද්‍යාත්මක උරුමය ආරක්ෂණය
03. පුරාවිද්‍යාත්මක උරුමය ලේඛනගත කිරීම
    i). ස්ථාන සහ ස්මාරක
    ii). චංචල පුරාවස්තු
04. පුරාවිද්‍යාත්මක උරුමය පිළිබඳ මහජන අවබෝධය ප්‍රවර්ධනය කිරීම.
05. පුරාවිද්‍යාත්මක ස්ථාන/ ස්මාරක හා චංචල පුරාවස්තු සංරක්ෂණය හා නඩත්තුව.
06. පර්යේෂණ

1.3. ප්‍රධාන කාර්යයන්

1. ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය හඳුනා ගැනීම.
2. ශ්‍රී ලංකාවේ චංචල හා නිශ්චල පුරාවිද්‍යාත්මක උරුමය ලේඛනගත කිරීම.
3. පුරාවිද්‍යාත්මක උරුමය විනයානුකූලව සංරක්ෂණය කිරීම, නඩත්තු කර පවත්වාගෙන යාම හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
4. පුරාවිද්‍යා ආඥා පනත ක්‍රියාත්මක කිරීම.
5. සංස්කෘතික දේපල පනත ක්‍රියාත්මක කිරීම.
6. පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක මහජනයා වෙත ඉදිරිපත් කිරීම.
7. විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේදී පුරාවිද්‍යාත්මක වටිනාකම්න් යුතු ස්ථානවලට සිදුවන හානිය පිළිබඳ හානි ඇගයුම් සමීක්ෂණ කටයුතු කිරීම.

1.4. සංවිධාන සටහන


සංවිධාන ව්‍යුහය -පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ ජනරාල්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන) 01 (ශ්‍රී.ප.ත.සේ. විශේෂ ශ්‍රේණිය)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) 01 (දෙපාර්තමේන්තු)
ප්‍රධාන ඒකාබද්ධ කළමනාකරු 01 (ශ්‍රී.ප.ත.සේ. විශේෂ ශ්‍රේණිය)
ප්‍රධාන ගණකාධිකාරි 01 (ශ්‍රී.ප.ත.සේ. ශ්‍රේණිය I)
ප්‍රධාන ඉංජිනේරු 01 (ශ්‍රී.ප.ත.සේ. ශ්‍රේණිය I)
ප්‍රධාන ආරක්ෂක විශේෂඥ 01
අධ්‍යක්ෂ (පාලන) 01 (ශ්‍රී.ප.ත.සේ. ශ්‍රේණිය I)
අධ්‍යක්ෂ (ව්‍යා.ශ.ආ.ඇ.) 01 (දෙපාර්තමේන්තු ආඥා - ශ්‍රේණිය I)
අධ්‍යක්ෂ (ඉ.ශා.) 01 (දෙපාර්තමේන්තු)
අධ්‍යක්ෂ (ව්‍යාප්තිකරණ සංවර්ධන) 01 (ශ්‍රී.ප.ත.සේ. - ශ්‍රේණිය I)
අධ්‍යක්ෂ (ඉංජිනේරු) 01 (ශ්‍රී.ප.ත.සේ. - ශ්‍රේණිය I)
අධ්‍යක්ෂ (ආරක්ෂක සංවර්ධන) 01 (ශ්‍රී.ප.ත.සේ. - ශ්‍රේණිය I)
අධ්‍යක්ෂ (ආරක්ෂක සංවර්ධන) 01 (ශ්‍රී.ප.ත.සේ. - ශ්‍රේණිය I)
අධ්‍යක්ෂ (ඉඩම්) 01 (දෙපාර්තමේන්තු)
අධ්‍යක්ෂ (ගිණුම්) 01 (දෙපාර්තමේන්තු)
අධ්‍යක්ෂ (ප්‍රසිද්ධ සම්බන්ධතා) 01 (දෙපාර්තමේන්තු)
අධ්‍යක්ෂ (ප්‍රවර්ධන) 01 (දෙපාර්තමේන්තු)
අධ්‍යක්ෂ (පාලන) 01 (දෙපාර්තමේන්තු)
ප්‍රධාන අභ්‍යන්තර විගණක 01 (ශ්‍රී.ප.ත.සේ. විශේෂ ශ්‍රේණිය)
ප්‍රධාන ඒකාබද්ධ කළමනාකරු 01 (ශ්‍රී.ප.ත.සේ. ශ්‍රේණිය I)
ප්‍රධාන ගණකාධිකාරි 01 (ශ්‍රී.ප.ත.සේ. ශ්‍රේණිය I)
ප්‍රධාන ඉංජිනේරු 01 (ශ්‍රී.ප.ත.සේ. ශ්‍රේණිය I)
ප්‍රධාන ආරක්ෂක විශේෂඥ 01
අධ්‍යක්ෂ (පාලන) 01 (ශ්‍රී.ප.ත.සේ. ශ්‍රේණිය I)
අධ්‍යක්ෂ (ව්‍යා.ශ.ආ.ඇ.) 01 (දෙපාර්තමේන්තු ආඥා - ශ්‍රේණිය I)
අධ්‍යක්ෂ (ඉ.ශා.) 01 (දෙපාර්තමේන්තු)
අධ්‍යක්ෂ (ව්‍යාප්තිකරණ සංවර්ධන) 01 (ශ්‍රී.ප.ත.සේ. - ශ්‍රේණිය I)
අධ්‍යක්ෂ (ඉංජිනේරු) 01 (ශ්‍රී.ප.ත.සේ. - ශ්‍රේණිය I)
අධ්‍යක්ෂ (ආරක්ෂක සංවර්ධන) 01 (ශ්‍රී.ප.ත.සේ. - ශ්‍රේණිය I)
අධ්‍යක්ෂ (ආරක්ෂක සංවර්ධන) 01 (ශ්‍රී.ප.ත.සේ. - ශ්‍රේණිය I)
අධ්‍යක්ෂ (ඉඩම්) 01 (දෙපාර්තමේන්තු)
අධ්‍යක්ෂ (ගිණුම්) 01 (දෙපාර්තමේන්තු)
අධ්‍යක්ෂ (ප්‍රසිද්ධ සම්බන්ධතා) 01 (දෙපාර්තමේන්තු)
අධ්‍යක්ෂ (ප්‍රවර්ධන) 01 (දෙපාර්තමේන්තු)
ප්‍රධාන අභ්‍යන්තර විගණක 01
ප්‍රධාන ඒකාබද්ධ කළමනාකරු 01
ප්‍රධාන ගණකාධිකාරි 01
ප්‍රධාන ඉංජිනේරු 01
ප්‍රධාන ආරක්ෂක විශේෂඥ 01
ප්‍රාදේශීය කාර්යාල - කා.ප්‍රා.නි.සේ. (අති ශ්‍රේණිය)
ප්‍රධාන කාර්යාලය 01
මධ්‍යම පළාත 01
දකුණු පළාත 01
වයඹ පළාත 01

01	පාලන	-	පාලන
02	පුහුණු හා වෙනත්	-	පුහුණු හා වෙනත්
03	ව්‍යා. ක්‍රියා. හා ඇ.	-	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ඇගයීම
04	ව්‍යා. මෙ. හා අ.	-	ව්‍යාපෘති මෙහෙයුම් හා අධීක්ෂණ
05	ග.ලේ.	-	ගවේෂණ හා ලේඛන ගත කිරීම්
06	පුවි. බල.තක්.	-	පුරාවිද්‍යාත්මක බලපෑම් තක්සේරුකරණය
07	මුහුදු. පු. ගවේ	-	මුහුදු පුරාවිද්‍යා ගවේෂණය
08	කැණීම්	-	කැණීම්
09	කැ.තක්.හා.පර්	-	කැණීම් තක්සේරුකරණය හා පර්යේෂණ
10	වාස්තු විද්‍යා සං.	-	වාස්තු විද්‍යා සංරක්ෂණ
11	වැඩ හා ලෝ.උ.	-	වැඩබිම් හා ලෝක උරුම
12	භූමි අලංකරණය	-	භූමි කළමනාකරණය
13	නව ඉදිකිරීම්	-	නව ඉදිකිරීම්
14	රසායන සංරක්ෂණ	-	රසායන සංරක්ෂණය
15	චිත්‍ර සංර.	-	චිත්‍ර සංරක්ෂණය
16	පුරාවස්තු සංර	-	පුරාවස්තු සංරක්ෂණය
17	අභි. නාණක විද්‍යා	-	අභිලේඛන හා නාණක විද්‍යා
18	අභිලේඛන	-	අභිලේඛන
19	නාණක විද්‍යා	-	නාණක විද්‍යා
20	ප්‍රවර්ධන	-	ප්‍රවර්ධන
21	තෙරතුරු කළ. හා ප්‍රකා.	-	තොරතුරු කළමනාකරණ හා ප්‍රකාශන
22	වැඩබිම් හා ස්මාරක	-	වැඩබිම් හා ස්මාරක
23	ආයතනික ගොඩනැගිලි	-	ආයතනික ගොඩනැගිලි
24	ජේ.කා.නි./ජේ.සැ.ශි.	-	ජ්‍යෙෂ්ඨ කාර්මික නිලධාරී / ජ්‍යෙෂ්ඨ සැලසුම් ශිල්පි
25	නි.අ. / ස.අ.	-	නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ
26	ශ්‍රී. ලං. ප. සේ.	-	ශ්‍රී ලංකා පරිපාලන සේවය
27	ශ්‍රී. ලං. ග. සේ.	-	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය
28	ශ්‍රී. ලං. ඉ. සේ.	-	ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය
29	ශ්‍රී. ලං. වා. සේ.	-	ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවය
30	ශ්‍රී. ලං. විද. සේ.	-	ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය
31	ක. සේ.නි.සේ.	-	කළමනාකරණ සේවා නිලධාරී සේවය
32	ශ්‍රී. ලං. තා. සේ.	-	ශ්‍රී ලංකා තාක්ෂණ සේවය

1.5. දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රධාන අංශ / පළාත් හා දිස්ත්‍රික් කාර්යාල

➢ දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රධාන අංශ

ශාස්ත්‍රීය අංශ

- ගවේෂණ හා ලේඛනගත කිරීම් අංශය
- කැණීම් අංශය
- කෞතුකාගාර අංශය
- වාස්තු විද්‍යා සංරක්ෂණ අංශය
- රසායන සංරක්ෂණ අංශය
- අභිලේඛන හා නාණක විද්‍යා අංශය
- නඩත්තු අංශය
- ප්‍රචර්ධන අංශය
- මාධ්‍ය අංශය

ශාස්ත්‍රීය නොවන අංශ

- ගිණුම් අංශය
- පාලන අංශය
- ව්‍යාපෘති මෙහෙයුම් හා ඇගයීම් අංශය
- නීති අංශය

➢ දෙපාර්තමේන්තුව යටතේ පවතින පළාත් හා දිස්ත්‍රික් පුරාවිද්‍යා කාර්යාල

- බස්නාහිර පළාත
- මධ්‍යම පළාත
- දකුණු පළාත
  - ගාල්ල/ මාතර දිස්ත්‍රික්ක
  - හම්බන්තොට දිස්ත්‍රික්කය
- උතුරු පළාත
  - යාපනය/ කිළිනොච්චි දිස්ත්‍රික්ක
  - මන්නාරම්/ මුලතිව්/ වවුනියා දිස්ත්‍රික්ක
- වයඹ පළාත
- උතුරුමැද පළාත
  - අනුරාධපුර දිස්ත්‍රික්කය
  - පොළොන්නරුව දිස්ත්‍රික්කය
- ඌව පළාත
  - බදුල්ල දිස්ත්‍රික්කය
  - මොණරාගල දිස්ත්‍රික්කය
- සබරගමුව පළාත
  - කෑගල්ල දිස්ත්‍රික්කය
  - රත්නපුර දිස්ත්‍රික්කය
- නැගෙනහිර පළාත
  - අම්පාර/මඩකලපුව දිස්ත්‍රික්ක
  - ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

➢ පළාත් කාර්යාල යටතේ ඇති කලාප කාර්යාල

1. බස්නාහිර පළාත
   කොළඹ/ගම්පහ/කළුතර
   - අංක 01 - කෝට්ටේ කලාපය
   - අංක 02 - කොළඹ කලාපය
   - අංක 03 - උඩුගම්පොළ කලාපය
   - අංක 04 - ගම්පහ කලාපය
   - අංක 05 - පතහවත්ත
   - අංක 06 - ගනේඋඩ

2. මධ්‍යම පළාත
   මහනුවර/නුවරඑළිය/මාතලේ
   - අංක 01 - සීගිරිය
   - අංක 02 - දඹුල්ල
   - අංක 03 - මැණික්දෙන
   - අංක 04 - මොරගහකන්ද
   - අංක 05 - නාලන්ද ගෙඩිගේ
   - අංක 06 - මාතලේ
   - අංක 07 - හාරිස්පත්තුව
   - අංක 08 - මහනුවර
   - අංක 09 - යටිනුවර
   - අංක 10 - උඩුනුවර
   - අංක 11 - කුණ්ඩසාලය
   - අංක 12 - හගුරන්කෙත
   - අංක 13 - කොත්මලේ
   - අංක 14 - නුවරඑළිය

3. දකුණු පළාත -
   ගාල්ල/ මාතර දිස්ත්‍රික්ක
   - අංක 01 - හික්කඩුව
   - අංක 02 - ගාල්ල
   - අංක 03 - කඩවත් සතර හා ගාලු කොටුව
   - අංක 04 - මාතර
   - අංක 05 - කඹුරුපිටිය

4. දකුණු පළාත -
   හම්බන්තොට දිස්ත්‍රික්කය
   - අංක 01 - කටුවන
   - අංක 02 - කසාගල
   - අංක 03 - හම්බන්තොට
   - අංක 04 - තිස්සමහාරාමය

5.	උතුරු පළාත -	• අංක 01	-	යාපනය
	යාපනය/ කිලිනොච්චි දිස්ත්‍රික්ක	• අංක 02	-	දූපත්
		• අංක 03	-	වලිකාමම්
		• අංක 04	-	වඩමාරච්චි
		• අංක 05	-	තෙන්මාරච්චි
		• අංක 06	-	කිලිනොච්චි
6.	උතුරු පළාත -	• අංක 01	-	වවුනියාව
	මන්නාරම්/ මුලතිව්/ වව්නියා දිස්ත්‍රික්ක	• අංක 02	-	මුලතිව්
		• අංක 03	-	මන්නාරම
7.	වයඹ පළාත	• අංක 01	-	පුත්තලම
	කුරුණෑගල / පුත්තලම	• අංක 02	-	තෝනිගල
		• අංක 03	-	හලාවත
		• අංක 04	-	යාපහුව 01
		• අංක 05		යාපහුව 02
		• අංක 06	-	අරන්කැලේ
		• අංක 07	-	කුරුණෑගල
		• අංක 08	-	පඩුවස්නුවර
		• අංක 09	-	දඹදෙණිය
		• අංක 10	-	හස්තිකුච්චි
8.	උතුරුමැද පළාත	• අංක 01	-	පදවිය
	අනුරාධපුර දිස්ත්‍රික්කය	• අංක 02	-	කිරලාගල
		• අංක 03	-	මිහින්තලය
		• අංක 04	-	නැගෙනහිර නුවර ගම් පළාත
		• අංක 05	-	පුජා නගරය
		• අංක 06	-	තන්තිරිමලය
		• අංක 07	-	මානාකන්ද
		• අංක 08		රිටිගල
		• අංක 09	-	උපුල්වෙහෙර
		• අංක 10	-	මැදවච්චිය
		• අංක 11	-	තඹුත්තේගම

		• අංක 12	-	නොච්චියාගම
		• අංක 13	-	ඇතුල්නුවර
9.	උතුරුමැද පළාත	• අංක 01	-	පොළොන්නරුව
	පොළොන්නරුව දිස්ත්‍රික්කය	• අංක 02	-	මැදිරිගිරිය
		• අංක 03	-	නාමල්පොකුණ
10.	ඌව පළාත	• අංක 01	-	නාගදීපය
	බදුල්ල දිස්ත්‍රික්කය	• අංක 02	-	බදුල්ල
		• අංක 03	-	දියතලාව
11.	ඌව පළාත	• අංක 01	-	ගලබැද්ද
	මොණරාගල දිස්ත්‍රික්කය	• අංක 02	-	මාළිගාවිල
		• අංක 03	-	බිබිල
		• අංක 04	-	බුදුරුවගල
12.	සබරගමුව පළාත	• අංක 01		දනගිරිගල
	කෑගල්ල දිස්ත්‍රික්කය	• අංක 02		දැලිවල
		• අංක 03		කෑගල්ල
		• අංක 04		සීතාවක
13.	සබරගමුව පළාත	• අංක 01		රත්නපුර
	රත්නපුර දිස්ත්‍රික්කය	• අංක 02		මඩුවන්වෙල
		• අංක 03		බුදුගල
14.	නැගෙනහිර පළාත	• අංක 01		පදියදොර
	අම්පාර/ මඩකලපුව දිස්ත්‍රික්ක	• අංක 02		ඔවාගිරිය
		• අංක 03		දීඝවාපීය
		• අංක 04		සමන්තුරේ
		• අංක 05		ලාහුගල
15.	නැගෙනහිර පළාත	• අංක 01		ගෝමරන්කඩවල
	ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය	• අංක 02		ත්‍රිකුණාමලය
		• අංක 03		සේරුවිල

1.6. දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන/ අරමුදල්

➢ **2020 වර්ෂය සඳහා වෙන්කර ඇති මුල්‍ය ප්‍රතිපාදන සහ ප්‍රගතිය (2020.12.31 දිනට)**

		ප්‍රතිපාදන (රු.මි.)		ප්‍රගතිය (රු.මි.)	
		මූලධන	පුනරාවර්තන	මූලධන	පුනරාවර්තන
වැඩසටහන 01	207 - 01 - 01	7.598	235.960	4.769	212.694
වැඩසටහන 02	207 - 02 - 02	146.648	813.252	84.119	793.542
		154.246	**1,049.212**	**88.888**	**1,006.236**
				57%	**96%**

➢ **2020 වර්ෂය සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදලින් වෙන්කර ඇති ප්‍රතිපාදන සහ ප්‍රගතිය (2020.12.31 දිනට)**

වර්ෂය	ප්‍රතිපාදන (රු.මි.)	ප්‍රගතිය	
2017	232.945	170.111	73%
2018	370.706	69.586	19%
2019	344.896	43.936	13%
2020	-	-	-

➢ **2020 වර්ෂය සඳහා බාහිර ආයතන ආධාර මඟින් ලබාදී ඇති ප්‍රතිපාදන සහ ප්‍රගතිය (2020.12.31 දිනට)**

➢

වර්ෂය	ප්‍රතිපාදන (රු.මි.)	ප්‍රගතිය	
2018	48.304	6.832	14%
2019	68.799	2.597	4%
2020	39.557	11.136	28%

සටහන:- මධ්‍යම සංස්කෘතික අරමුදල් ප්‍රතිපාදන සහ බාහිර ආයතන ආධාර මඟින් ලබාදෙන ප්‍රතිපාදන ඉදිරි වර්ෂ සඳහා ද ක්‍රියාත්මක වේ.

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

1. අ) ව්‍යාපෘතියේ නම :- රජගලතැන්න පුරාවිද්‍යා ස්ථානය සංවර්ධනය
   ආ) දායක නියෝජිත ආයතනය :- ඇමරිකානු අරමුදල
   ඇ) ව්‍යාපෘති ඇස්තමේන්තු ගත වියදම :- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව අතර සිදු කිරීමට තිබූ ගිවිසුම් ගත ක්‍රියාවලියේ තිබූ ගැටළුවක් හේතුවෙන් මේ වර්ෂයට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීය.
   (2020 වර්ෂය සඳහා ව්‍යාපෘතියට ලැබුණු මුදල - රු.මි.5.257)
   ඈ) ව්‍යාපෘති කාල සීමාව :- 2017 – 2022

02.පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම.

2.1 විශේෂ ජයග්‍රහන, අභියෝග හා ඉදිරි ඉලක්ක

2019 - 2020 වර්ෂ සඳහා වෙන්කර ඇති මූල්‍ය ප්‍රතිපාදන සහ ප්‍රගතිය

	2019				2020			
	ප්‍රතිපාදන (රු.මි.)		ප්‍රගතිය (රු.මි.)		ප්‍රතිපාදන (රු.මි.)		ප්‍රගතිය (රු.මි.)	
	මූලධන	පුනරාවර්තන	මූලධන	පුනරාවර්තන	මූලධන	පුනරාවර්තන	මූලධන	පුනරාවර්තන
වැඩසටහන 01 207 - 01 - 01	11.30	200.50	8.86	196.32	7.60	235.96	4.77	212.69
වැඩසටහන 02 207 - 02 - 02	100.70	764.50	76.83	762.26	146.65	813.25	84.12	793.54
	112.00	**965.00**	**85.69**	**958.58**	**154.25**	**1049.21**	**88.89**	**1006.24**
			77%	**99%**			**57%**	**96%**
සටහන : 5 / 2019 ජාතික අයවැය චක්‍රලේඛය අනුව, 25% ඉතුරුම් (රු.මි. 28.00) අඩු කිරීමෙන් පසු මූලධන ප්‍රගතිය		**84.00**	**85.69**	**102%**				
සමස්ත මූල්‍ය ප්‍රගතිය		**1,049.00**	**1,044.27**	**100%**				

2020 වර්ෂය තුළ අතුරු සම්මත ගිණුම් ආශ්‍රිතව වෙන් වූ මූල්‍ය ප්‍රතිපාදන අනුව කාර්තු වශයෙන් පළාත් සහ දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද (ඇස්තමේන්තුගත) ව්‍යාපෘති සංඛ්‍යාව 407 කි. 2020 වර්ෂය පුරා පැවති Covid – 19 ගෝලීය වසන්ගත තත්ත්වය හේතුවෙන් රටේ ආර්ථික හා සාමාන්‍ය ක්‍රියාකාරිත්වය සැලකිය යුතු කාලපරිච්ඡේදයක් යථා පැවැත්මෙන් ක්‍රියාත්මක නොවූ බැවින් ද, අහිතකර මූල්‍ය වතාවරණය මත ප්‍රතිපාදන සීමා කිරීම නිසා ක්‍රියාත්මකව පැවති ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාවය ලබාදීම සහ නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සීමා කිරීම, පළාත් සංචරණ සීමා ක්‍රියාත්මක වූ කාලපරිච්ඡේදය තුළ තත්කාර්ය සේවකයින් ප්‍රාදේශීය වැඩබිම් වෙත යොමු කිරීමට පැවති අපහසුතා හේතුවෙන් බොහොමයක් ව්‍යාපෘතිවල වැඩ ප්‍රමාද වීම මෙන්ම ඉදිකිරීම් ක්ෂේත්‍රයේ යෙදවුම් සහ අනෙකුත් සැපයුම් සීමාසහිත වීම වර්ෂයේ ඇස්තමේන්තුගත ව්‍යාපෘති සංඛ්‍යාවෙන් වැඩ අවසන් කිරීමට හැකි වූ ව්‍යාපෘති සංඛ්‍යාව 200 ක් පමණ විය. ඒ අනුව 2020 වර්ෂයේ මූල්‍ය වැය කිරීම් පහත සඳහන් සංඛ්‍යා සටහන මඟින් දක්වා ඇත.

වැඩ සටහන් අනුව 2020 වර්ෂය සඳහා වෙන්කර ඇති මූල්‍ය ප්‍රතිපාදන සහ ප්‍රගතිය

වැඩ සටහන	වැය විස්තරය	ප්‍රතිපාදන රු.මිලියන	තත්‍ය වියදම රු.මිලියන	ප්‍රගතිය %
වැඩ සටහන 01 207-01-01 සාමාන්‍ය පරිපාලනය	පුනරාවර්තන	235.96	212.69	90%
	මූලධන	7.60	4.77	63%
	උප එකතුව	**243.56**	**217.46**	**89%**
වැඩ සටහන 02 207-02-02 පුරාවිද්‍යා සේවය	පුනරාවර්තන	813.25	793.54	98%
	මූලධන	146.65	84.12	57%
	උප එකතුව	**959.90**	**877.66**	**91%**
	මුළු එකතුව	**1,203.46**	**1,095.12**	**91%**

මුළු ප්‍රතිපාදන	පුනරාවර්තන	1,049.21	1,006.23	96%
	මූලධන	154.25	88.89	57%
	මුළු එකතුව	**1,203.46**	**1,095.12**	**91%**

2020 වර්ෂයේ මූලධන වැය කිරීම් රුපියල් මිලියන 88.89 ක් වූ අතර, 2020 වසර සඳහා වෙන් කරන ලද මූලධන ප්‍රතිපාදන රුපියල් මිලියන 154.25 සමඟ සැසඳීමේ දී 57% ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇත. එය 2019 වර්ෂයේ වාර්තා කර ඇති 77% ක් වූ (මූලධන) ප්‍රගතියට සාපේක්ෂව 20% අඩු වීමකි. වර්ෂය තුළ පුනරාවර්තන වැය කිරීම් රුපියල් මිලියන 1,006.23 ක් වූ අතර, වර්ෂය සඳහා වෙන් කරන ලද පුනරාවර්තන ප්‍රතිපාදන රුපියල් මිලියන 1,049.21 හි ප්‍රතිශතයක් ලෙස ගත් විට එහි මූල්‍ය ප්‍රගතිය 96% කි. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේ මුළු වියදම රුපියල් මිලියන 1,095.12 වන අතර, එය 2020 වසර සඳහා වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන මුදල වන රුපියල් මිලියන 1,203.46 හා සැසඳීමේ දී සමස්ත මූල්‍ය ප්‍රගතිය 91% ක් විය.



2020 වසරේ මුහුණ දීමට සිදු වූ අභියෝග හමුවේ වුවද, ගවේෂණ, කැණීම්, සංරක්ෂණ, නඩත්තු, ප්‍රවර්ධන සහ කෞතුකාගාර අංශයන් වර්ෂය තුළ සිදු කර ඇති කාර්යභාරය නිරීක්ෂණය කිරීමේ දී අපේක්ෂිත ප්‍රගතිය ළඟා කර ගැනීමට සමත් වීම වසරේ ලැබූ විශේෂ ජයග්‍රහනයකි. මේ අනුව 2020 වසරේ සංවර්ධන වැඩසටහන් යටතේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිවල සමස්ත භෞතික ප්‍රගතිය 64% ක් විය. එසේම බාහිර ප්‍රතිපාදන යටතේ ද සැලකිය යුතු කාර්යභාරයක් වසර තුළ සිදු කරන ලදි. පුරාවස්තු අඥාපනනට අදාළ සංශෝධනයන් සිදු කිරීමේ කටයුතු ද 2020 වසරේ සිදු විය.

දෙපාර්තමේන්තුවට ලැබූ මූල්‍ය ප්‍රතිපාදනයන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස උපයෝජනය කරමින් ශාස්ත්‍රීය අංශයන් ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් කාර්යාල එක්ව ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිවල ප්‍රගතිය අංශ අනුව හා පළාත් / දිස්ත්‍රික් මට්ටමින් පහත සංඛ්‍යා සටහන් මඟින් සාරාංශ ගත කර දක්වා ඇත.

අංශ අනුව ප්‍රගතිය (සාරාංශය) - 2020

වැය ශීර්ෂය	අංශය	ඇස්තමේන්තු ගණන්	බැඳ අවසන් ව්‍යාපෘති	වෙන්කළ මුදල (රු.)	2020.12.31 දිනට ප්‍රගතිය				භෞතික ප්‍රගතිය %
					මූල්‍ය ප්‍රගතිය (රු.)	%	බැරකම් සහිත මූල්‍ය ප්‍රගතිය (රු.)	%	
02 -02 -207 - 2509 (08)	ගවේෂණ	25	16	4,397,046.00	1,464,760.00	**33%**	2,386,089.28	54%	**71%**
	කැණීම්	6	2	2,984,450.00	1,359,498.63	**46%**	1,359,498.63	46%	**67%**
	අභිලේඛන	5	2	862,000.00	270,074.50	**31%**	752,545.00	87%	**69%**
02 -02 -207 - 2509 (09)	වාස්තුවිද්‍යා	42	14	44,188,599.60	17,312,979.55	**39%**	25,730,116.82	58%	**58%**
	රසායන	65	19	18,412,044.10	634,441.00	**3%**	3,168,890.75	17%	**54%**
	නඩත්තු	145	83	36,830,320.09	16,578,925.12	**45%**	19,071,226.98	52%	**76%**
01/ 02 -2001		9	3	3,247,490.00	2,287,236.35	**70%**	2,769,653.05	85%	**59%**
01/ 02 - 1303		21	6	8,962,092.25	3,857,681.34	**43%**	4,652,237.55	52%	**60%**
02 -02 -207 - 2509 (10)	කෞතුකාගාර	34	32	2,554,869.25	1,151,169.29	**45%**	1,261,648.89	49%	**83%**
	ප්‍රවර්ධන	50	19	16,880,068.00	9,846,359.86	**58%**	11,328,618.75	67%	**55%**
	මාධ්‍ය ඒකකය	2	2	1,413,200.00	703,789.00	**50%**	703,789.00	50%	**60%**
02 - 02 -207- 2509 (5)	රජගලතැන්න සංරක්ෂණය	1	1	19,215,000.00	12,653,220.23	**66%**	12,653,220.23	66%	**55%**
02 -02 -207 - 2509 (12)	රිටිගල සංරක්ෂණය	1	1	3,000,000.00	2,845,209.00	**95%**	2,845,209.00	95%	**35%**
3 -02 -207 - 2509 (15)	කන්නියා උණු වතුර ළිං නඩත්තුව	1		2,600,000.00	ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අධීක්ෂණය යටතේ නඩත්තු කටයුතු සිදු කෙරේ				
	මුදල්			9,673,200.00	4,909,292.23	**51%**	4,909,292.23	51%	
	පාලන			1,465,000.00	66,920.00	**5%**	66,920.00	5%	
තුන්වන කාර්තුව සඳහා වූ වියදම්					11,863,148.08				
	මුළු එකතුව	**407**	**200**	**154,246,402.46**	**87,804,704.18**	**57%**	**93,658,956.16**	**61%**	**64%**

පළාත් හා දිස්ත්‍රික්ක අනුව ප්‍රගතිය (සාරාංශය) - 2020

අංශය	ඇස්තමේන්තු ගණන	වැඩ අවසන් ව්‍යාපෘති	වෙන්කළ මුදල රු.මි.	2020.12.31 දිනට ප්‍රගතිය				
				මූල්‍ය ප්‍රගතිය රු.මි	%	බැරකම් සහිත මූල්‍ය ප්‍රගතිය රු.මි	%	භෞතික ප්‍රගතිය %
බස්නාහිර පළාත	21	*10*	3,728,214.50	2,063,297.23	**55%**	2,229,892.26	60%	**60%**
මධ්‍යම පළාත	41	*26*	11,082,562.47	7,855,209.26	**71%**	8,612,490.20	78%	**78%**
දකුණු පළාත (ගාල්ල/ මාතර)	26	*15*	3,033,669.60	1,756,541.41	**58%**	2,053,057.60	68%	**80%**
දකුණු පළාත (හම්බන්තොට)	20	*9*	2,390,388.60	1,137,782.00	**48%**	1,678,716.00	70%	**71%**
උතුරු පළාත (යාපනය / කිලිනොච්චි)	13	*3*	2,583,464.20	134,005.70	**5%**	291,628.70	11%	**62%**
උතුරු පළාත (වව්නියා / මන්නාරම/ මුලතිව්)	8	3	4,741,046.50	1,360,030.89	**29%**	2,571,797.57	54%	**55%**
වයඹ පළාත	36	*14*	9,888,742.00	1,979,879.03	**20%**	5,256,412.92	53%	**64%**
උතුරුමැද පළාත (අනුරාධපුරය)	34	*24*	9,983,466.42	4,554,656.97	**46%**	4,588,958.25	46%	**75%**
උතුරුමැද පළාත (පොළොන්නරුව)	14	9	2,189,635.60	628,664.00	**29%**	1,534,381.50	70%	**73%**
ඌව පළාත (බදුල්ල)	17	9	4,399,780.80	1,739,074.66	**40%**	1,960,266.48	45%	**77%**
ඌව පළාත (මොණරාගල)	16	13	3,189,899.25	752,195.00	**24%**	2,145,641.50	67%	**72%**
සබරගමුව පළාත (කෑගල්ල)	20	13	6,486,938.00	3,640,893.00	**56%**	4,037,932.40	62%	**67%**
සබරගමුව පළාත (රත්නපුර)	21	8	8,724,171.00	2,574,182.50	**30%**	5,382,166.00	62%	**56%**
නැගෙනහිර පළාත (අම්පාර/ මඩකලපුව)	23	13	12,444,552.50	5,605,779.90	**45%**	6,657,154.82	53%	**67%**
නැගෙනහිර පළාත (ත්‍රිකුණාමලය)	14	8	1,016,145.00	237,116.00	**23%**	296,399.00	29%	**58%**
ප්‍රධාන කාර්යාලය මඟින්	59	16	45,887,410.60	15,589,925.75	**34%**	19,235,181.95	42%	**49%**
රජගලතැන්න පුරාවිද්‍යා ස්ථානය	1	1	19,215,000.00	12,653,220.23	**66%**	12,653,220.23	66%	**55%**
රිටිගල පුරාවිද්‍යා ස්ථානය	1		3,000,000.00	2,845,209.00	**95%**	2,845,209.00	95%	**35%**
කන්නියා උණුවතුර ළිං නඩත්තුව	1		2,600,000.00	ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අධීක්ෂණය යටතේ නඩත්තු කටයුතු සිදු කෙරේ				
මුදල්			9,673,200.00	4,909,292.23	**51%**	4,909,292.23	51%	
පාලන			1,465,000.00	66,920.00	**5%**	66,920.00	5%	
01 - 02 - 1303	21	6	8,962,092.25	3,857,681.34	**43%**	4,652,237.55	52%	**60%**
තුන්වන කාර්තුව සඳහා වූ වියදම්				11,863,148.08				
	407	**200**	**154,246,402.46**	**87,804,704.18**	**57%**	**93,658,956.16**	**61%**	**64%**

2020 වර්ෂයේ ක්‍රියාත්මක වූ ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති කිහිපයක්;

❖ E- Heritage ව්‍යාපෘතිය සඳහා පුරාවිද්‍යා ස්ථානයෙහි තොරතුරු ලබා ගැනීම

සංචාරක ප්‍රවර්ධනය සඳහා ඩිජිටල් තාක්ෂණය උපයෝගි කර ගනිමින් අන්තර්ජාල බිහි දොරක් (Web App) සහ ජංගම දුරකථන බිහිදොරක් (Mobile App) සකස් කිරීම තුළින් ලංකාවම ආවරණය වන පරිදි පුරාවිද්‍යා ස්ථානයෙහි තොරතුරු රැස්කර මහජනතාව වෙත මුදා හැරීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදුකිරීමට සැලසුම් කර ඇත.




සීගිරිය ගවේෂණය

❖ යාපහුව පර්යේෂණ කැණීම

පූර්ව ඓතිහාසික යුගයේ සිට ඓතිහාසික යුගය දක්වා යුග වශයෙන් මැටි බඳුන්වල තාක්ෂණික, කලාත්මක විකාශය සහ වෙනත් උපයෝගිතාවයන් මත පුරාණ මැටි බඳුන්වල ප්‍රාදේශීය වෙනස්කම් හඳුනා ගැනීම මෙම කැණීමේ මුඛ්‍ය අරමුණ වේ. මෙහිදී අදියර කිහිපයක් යටතේ සිදු කළ කැණීම්වලින් වළං කොටස්, උළු කොටස්, අඟුරු, යකඩ ආදිය යබොර, පබළු, ඊතළ කුඩු ආදිය හමු වී ඇති අතර විද්‍යාගාර පර්යේෂණ සඳහා එම ස්ථානවලින් පස් නියැදි ලබා ගෙන ඇත. මෙම ව්‍යාපෘති කටයුතු 2021 වර්ෂයේදී ද ක්‍රියාත්මක කිරීමට නියමිතය.







❖ රිටිගල පුරාවිද්‍යා ස්ථානය සංරක්ෂණය.

2020 වර්ෂයේ සංරක්ෂණ කටයුතු ආරම්භ කිරීමට පෙර ස්ථානය ශුද්ධ පවිත්‍ර කර බැම්ම පදා ගැනීමේ කටයුතු සිදු කරන ලදි. ඉන් අනතුරුව ගල් පිහිටා ඇති ආකාරය අනුව අංකනය කර, ගල් ගලවා ඉවත් කර නැවත අංක පිළිවෙළට අනුව ගල් අසුරා ගැනීම සිදු කරන ලදි. පරණ සක්ක බැම්ම මත ගල් ඇසිරීමට පෙර සන අඩි 01 ප්‍රමාණයට සන අඩි 80 ක් දිගට කොන්ක්‍රීට් යෙදීමක් සිදු කරන ලදි. සක්ක ගල් භාවිතා කර බැම්ම බැඳීම ආරම්භ කළ අතර ඒ මත පඩි ගල් තැබීම සිදු කරන ලදි. එමෙන්ම රළපනාව බටහිර බැම්මේ අඩි 80 වක් දිගට පඩිපෙල් වරි 12 ක් සහ මේස වරිය සංරක්ෂණය කිරීමේ කටයුතු සිදු කරන ලදි. අවසන් කාර්තුවේදී අඩි 30ක් දුරට රළපනාව සංරක්ෂණය කිරීමට සැලසුම් කළ ද වර්ෂාව හේතුවෙන් ස්ථානය පිරිසිදු කිරීම සහ අංක යෙදීමේ කටයුතු අඩි 100ක් දුරට සිදු කරන ලදි. මෙම සංරක්ෂණ කටයුතු 2021 වර්ෂය මුළුල්ලේ ද ක්‍රියාත්මක වේ.







❖ ත්‍රිකුණාමලය සේරුනුවර පුරාවිද්‍යා කෞතුකාගාරයේ පුරාවස්තු සංරක්ෂණය

සේරුනුවර පුරාවිද්‍යා කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇති තඹ මිශ්‍ර ලෝහයෙන් නිමවූ කාසි, බුදුපිළිම, තැටි භාජනයක් ඇතුළු පුරාවස්තු කිහිපයක් සංරක්ෂණය කිරීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලදි. මෙම පුරාවස්තු එකතුව වාර්තාකරණයෙන් පසුව සංරක්ෂණ ක්‍රියාවලිව ආරම්භ කළ අතර යාන්ත්‍රිකව තඹ පිරිසිදු කිරීමේ කටයුතු සිදු කිරීමෙන් පසුව ආරක්ෂිත ආලේප ගල්වා සංරක්ෂණ කටයුතු නිමකරන ලදි.

සංරක්ෂණයට පෙර



සංරක්ෂණයට පසු



සංරක්ෂණයට පෙර





සංරක්ෂණට පසු







සංරක්ෂණයට පෙර



සංරක්ෂණයට පසු

❖ **සෝනුත්තර දාගැබ සංරක්ෂණය.**

2020 වසරේ දී ස්ථූපයේ පේසාවන් සංරක්ෂණය කර අවසන් වන අවස්ථාවේ දී විහාරාධිපති හිමිගේ ඉල්ලීම පරිදි කොට වෙහෙරක් ලෙස සංරක්ෂණය කිරීමට පෙර ගෙන තිබූ තීරණය 2020 වසරේදී සම්පූර්ණ ස්ථූපය ගොඩ නැගීම සඳහා ඇස්තමේන්තු සකසන ලදි. ඒ අනුව කාර්තු ක්‍රමයට ලද ප්‍රතිපාදන මත සම්පූර්ණ ගර්භය බැඳ අවසන් කර හතරැස් කොටුව බැඳ අවසන් කරන ලදි. දේවතා කොටුව සැකසීම, කොත පැළඳීම හා මළුව සැකසීමෙන් පසු සුදුහුණු පිරියම් කිරීමේ කාර්යය ඉතිරි වී ඇත.





❖ ගඩලාදෙණිය ආවාසගෙයි වහල සංරක්ෂණය

ආවාසගෙයි වහල සඳහා පුරගෙය ඉදිකර ඉන් අනතුරුව පෙනි උළු සෙවිලි කර තිබූ වහලය උළු සහ රීප්ප සියල්ල ඉවත් කරන ලදි. ඉන් අනතුරුව දිරා තිබූ පරාල හා බාල්ක යට ලී වෙනුවට නව දැවයෙන් සකස් කර පරාල සහ බාල්ක යොදන ලදි. මැද මිදුලට බෑවුම් වන සේ යොදා තිබූ කාණු පිලි 4 සඳහා ලෑලි අතුරා ඒ මත GI ප්ලෙන් ෂීට් යොදා කාණු පිලි සකසන ලදි. අනතුරුව සිවිලින් ලෑලි යොදා GI ප්ලෙන් ෂීට් යොදා නව රීප්ප ගසා අර්ධ කවාකාර අන්තර් සම්බන්ධිත උළු වහලය සඳහා සෙවිලි කර කුමේර යෙදීමෙන් පසු නව කොත් පහක් යොදන ලදි.





❖ දෙපාර්තමේන්තු ප්‍රකාශන මුද්‍රණය සහ ප්‍රකාශයට පත් කිරීම.

පුරාවිද්‍යා ක්ෂේත්‍රය පිළිබඳව මහජනතාව සහ සිසුන් දැනුවත් වීම තුළින් උරුමය ආරක්ෂා වීම සහ ශාස්ත්‍රීය දැනුම වර්ධනය කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශන මුද්‍රණය සහ ප්‍රකාශයට පත් කිරීමේ වැඩසටහන යටතේ 2020 වර්ෂය තුළදී පුරාණ වාරි කර්මාන්තය (කොළඹ, මහනුවර හා කුරුණෑගල දිස්ත්‍රික් පොත් මුද්‍රණය), මහාචාර්ය ඔස්මන්ඩ් බොපේ ආරච්චිගේ Roots of Sri Lankan Art පොත මුද්‍රණය, Epigraphical Notes 22-23 පොත මුද්‍රණය සිදු කරන ලදි.



❖ වෙංකලාඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මායිම් කණු යෙදීම

නැගෙනහිර පළාතේ මඩකලපු දිස්ත්‍රික්කයට අයත් වෙංකලාඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පුරාවිද්‍යා ස්ථානවල සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා එම ස්ථාන වටා සීමා නිරවුල් කර මායිම් කණු යෙදීමේ ව්‍යාපෘතිය 2020 වර්ෂයේදී ආරම්භ කරන ලදි. නැගෙනහිර පුරාවිද්‍යා උරුමය සුරක්ෂිත කිරීම පිළිබඳව ජනාධිපති කාර්ය සාධක බලකායේ අවධානයට යොමුව පැවති හෙයින් සහ පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගේ හදිසි නියෝගයක් වශයෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෙදුන අතර වෙංකලාඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පුරාවිද්‍යා ස්ථාන ආවරණය වන පරිදි මෙම ව්‍යාපෘතිය යටතේ මායිම් ගල් 480 පමණ යෙදවීමට කටයුතු කරන ලදි.







වරකාගොඩ ගල්ලෙන් විහාරය නඩත්තු කිරීම





අභියෝග හා ඉදිරි දැක්ම

උරුම සංරක්ෂණයේ අරමුණ වන්නේ අතීත උරුමයට වර්තමාන ප්‍රජාවගෙන් එල්ලවන අහිතකර බලපෑම් වලින් ආරක්ෂා කර ගනිමින් අනාගතය වෙත භාර දීමේ අපේක්ෂාවයි. ශ්‍රී ලංකාව පුරා විසිරී ඇති 250,000 ක් පමණ වන පුරාවස්තු සංඛ්‍යාවකට භාරකාරිත්වය දරමින් කටයුතු කරන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව තරම් අභියෝගවලට ලක්වන වෙනත් ආයතනයක් නොමැති තරම් වේ. දෙපාර්තමේන්තුව සාමාන්‍යයෙන් මුහුණ දෙන අභියෝග සහ ගැටළු අතර,

- සංස්කෘතික උරුම ක්ෂේත්‍ර, වර්ධනය වන ජනගහණය සහ භූමි පරිභෝජන රටාවන් අතර සීමිත අවකාශය සඳහා වන තරහයේදී මුහුණ දීමට සිදු වී ඇති ගැටළු. එනම්, නෛතික රාමුව තුළ පවතින ඉඩකඩ සීමිත බැවින් ජීවමාන සංස්කෘතීන් පවත්වාගෙන යාමේ දී පැනනඟින ප්‍රායෝගික ගැටළු නිරාකරණය කිරීමට නොහැකි වීම සහ ගැසට් කරනු ලබන පුරාවිද්‍යාත්මක වටිනාකම්වන් යුත් ස්මාරක හා රක්ෂිතයන්හි මැනුම් කටයුතු සිදු කිරීමේ අපහසුතාවයක් පැවැතීම.
- ආරක්ෂක ක්‍රමවේදයන්වල පවතින දුර්වලතා.
- ජීවමාන පුරාකෘති පවත්වාගෙන යාමේ ගැටළු.
- ආගමික ස්ථාන පවත්වාගෙන යාමේ දී ඇතිවන සංස්කෘතික ගැටළු.
- මිත්‍යාමත සහ නොදැනුවත් බව නිසා ඇතිවන අනවසර කැණීම්.
- උරුමය සහ ප්‍රජාව අතර සබඳතාව දුරස්වීම මත දිගුකාලීනව ක්ෂේත්‍රයේ පැවැත්මට අභියෝග එල්ල වීමට ඇති ප්‍රවනතාවය, මේ හේතුවෙන් පුරාවස්තූන් සොරසතුරු උවදුරුවලට ලක්වීම සහ පුරාවස්තු සහ ස්මාරකයන්ගේ පැවැත්මට සිදුවන හානිය දිනෙන් දින ඉහළ යාම.
- තිරණ ගැනීමේ ක්‍රියාවලියට බද්ද වීම සඳහා ප්‍රජාව සතු දැනුමේ සහ හැකියාවේ අවම දාරිතාව සහ මැදිහත්වීම සම්බන්ධයෙන් පවතින නීතිමය ගැටළු.
- ආයතනමය දාරිතාවේ පවතින ගැටළු, එනම් මූල්‍ය සහ භෞතික සම්පත්වල හිඟකම, විශේෂඥ දැනුමේ සාපේක්ෂ හිඟය, අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පැවතීම, ඉතා කඩිනමින් සිදු කළ යුතු සංවර්ධන තත්ත්වයන් සඳහා අවශ්‍ය නිර්දේශ ලබා ගැනීමේ දී පවතින ප්‍රායෝගික ගැටළු මෙහිදී සැලකිය යුතු වේ.

දෙපාර්තමේන්තුව මුහුණ දෙන අභියෝග සාර්ථකව ජයගනිමින් දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දරන උත්සහයන් ශක්තිමත් කර ගනිමින් දෙපාර්තමේන්තුවේ ඉදිරි කටයුතු සැලසුම් කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වනු ඇත. මේ අනුව තිරසර සංවර්ධන හා සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්තීන්ට අනුගත වෙමින් කෙටිකාලීන හා මධ්‍ය කාලීන නියමු සැලසුම් මඟින් හඳුනා ගන්නා වැඩසටහන් තුළින් රටේ සංස්කෘතික හා ස්වාභාවික උරුමය ආරක්ෂා කර ගනිමින් **"පුරාවිද්‍යා ස්ථාන ප්‍රසස්ථ මට්ටමට ගැනීම", "විශ්වීය වැදගත්කමක් ඇති පුරාවිද්‍යා ස්ථාන ලෝක උරුම තත්ත්වයට උත්ශ්‍රේණි කිරීම සඳහා කටයුතු කිරීම"** සහ **"සමස්ත පුරාවිද්‍යාත්මක උරුමය මනාලෙස කළමනාකරණය කර මතු පරපුරට දායාද කිරීම"** දෙපාර්තමේන්තුවේ ඉදිරි දැක්ම සහ අරමුණු අතර ප්‍රධාන වේ.

2.2 ඉදිරියේදී ආයතනයේ කාර්යසාධනය වර්ධනය කර ගැනීම සඳහා අනුගමනය කිරීමට අපේක්ෂිත කෙටිකාලීන හා මධ්‍යකාලීන ක්‍රියාමාර්ග

1. උරුම සංරක්ෂණ ශික්ෂණය සඳහා වූ වැදගත්ම දායකත්වය වන්නේ සංරක්ෂණ ක්‍රියාදාමය සඳහා ප්‍රජාව මැදිහත් වීම, දිරිගැන්වීම සහ ප්‍රවර්ධනයයි.

ප්‍රජාව, පාසැල් සහ විශ්වවිද්‍යාල ළමුන්ගේ සහභාගිත්වයෙන් පුරාවිද්‍යා ස්ථාන ආශ්‍රිත ක්‍රියාකාරකම් සංවිධානය කිරීම, පුරාවිද්‍යා විෂය සම්බන්ධ දැනුවත් භාවය ප්‍රචලිත කිරීම සඳහා වැඩසටහන් මෙහෙය වීම, දෙස් / විදෙස් සංචාරකයින් උදෙසා ප්‍රදර්ශනාත්මක හා ප්‍රවර්ධන කටයුතු ඉහළ නැංවීම, ජාතික උරුමයන් සහ පුරාවිද්‍යාත්මක ස්ථාන පිළිබඳව වැරදි තොරතුරු සංචාරකයින් අතර ප්‍රචලිත වීම වැළැක්වීම සඳහා මහජනතාවන්නන්ට නිවැරදි දැනුම සහ තොරතුරු ලබා දීමේ ක්‍රමවේදයක් ඇති කිරීම. මේ යටතේ පුරාවිද්‍යා ස්ථානවල තොරතුරු මධ්‍යස්ථාන පිහිටු වීම. දැනටමත් තොරතුරු මධ්‍යස්ථාන 50ක් පිහිටුවා ඇත. පුරාවිද්‍යා ස්ථාන සඳහා විස්තර පුවරු, මාර්ගෝපදේශ පුවරු, ආරක්ෂිත ස්මාරක පුවරු, අනතුරු ඇගවීමේ පුවරු සවි කිරීම, සන්නිවේදන කටයුතු ප්‍රවර්ධනය සහ e – Heritage නමින් ICTA ආයතනය හා සම්බන්ධ වී පුරාවිද්‍යා ස්ථාන පිළිබඳ තොරතුරු අන්තර්ජාල බිහිදොර මඟින් මුදා හැරීමේ කටයුතු ප්‍රවර්ධනය කිරීම. සියලුම ජන කණ්ඩායම් සහ ආගම්වලට අයත් පුරාවිද්‍යාත්මක සහ ඓතිහාසික වටිනාකමක් ඇති ස්ථාන සහ ජාතික උරුමයන් පිළිබඳ තොරතුරු ඇතුළත් "ඩිජිටල් පුරාවිද්‍යා විශ්ව කෝෂය" නිර්මාණය කිරීම මෙම වැඩසටහන යටතේ ප්‍රමුඛ කොට සැලකේ.

2. හඳුනා ගන්නා නව පුරාවිද්‍යාත්මක ක්ෂේත්‍ර ගවේෂණය සහ පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, එහි ප්‍රතිඵලයන් ප්‍රකාශයට පත් කිරීම.

3. පුරාවිද්‍යා රක්ෂිත හා ආරක්ෂිත ස්මාරක හඳුනා ගෙන ගැසට් කිරීමට කටයුතු කිරීම සහ උරුම කළමනාකරණය සඳහා නිවැරදි අවකාශීය දත්ත රැස් කිරීම.

4. වාණිජ මට්ටමින් සිදුවන පුරාවස්තු සොරකම් කිරීම්, පුරාවස්තු විනාශය වැළැක්වීම සහ ක්ෂේත්‍රයේ පැවැත්ම සඳහා අවශ්‍ය නීති සංශෝධනය කිරීමට කටයුතු කිරීම.

5. පුරාවිද්‍යාත්මක උරුමයන් සංරක්ෂණය කිරීම.

6. පුරාවිද්‍යා ස්ථාන සහ ස්මාරක ආරක්ෂා කිරීම සහ ප්‍රදර්ශනාත්මක මට්ටමින් පවත්වා ගෙන යාම.

7. ඓතිහාසික පුරාවිද්‍යා ස්ථාන නැරඹීම සඳහා පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන් උදෙසා සනීපාරක්ෂක හා යටිතල පහසුකම් පුරාවිද්‍යා ස්ථානවලට හානියක් නොවන පරිදි ප්‍රමාණාත්මකව වැඩි දියුණු කිරීම.

8. දෙපාර්තමේන්තුවේ සහ ප්‍රාදේශීය කාර්යාලවල යටිතල පහසුකම් ප්‍රවර්ධනය, ශාස්ත්‍රීයමය කටයුතු හඳුනා ගනිමින් ඒ සඳහා පුහුණුව පුළුල් කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ ඵලදායිතාවය ඉහළ නැංවීම සහ ආයතනික කාර්ය භාරය සම්බන්ධ ගැටළු අවම කර ගැනීම සඳහා කටයුතු කිරීම දෙපාර්මේන්තුවේ සමස්ත කාර්යසාධනය ප්‍රශස්ථ මට්ටමට ළඟා කර ගැනීම සඳහා සපුරාගත යුතු ඉදිරි ක්‍රියාකාරකම් අතර ප්‍රධාන වේ.

2021 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන වැඩසටහන්

දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතික ප්‍රතිපත්තින්ට අනුව ප්‍රමුඛතාවය මත හඳුනා ගත් සහ කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු සංවර්ධන වැඩසටහන් මුල්කර 2021 වසරේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති ඇතුළත් ක්‍රියාකාරී සැලැස්මේ සාරාංශය හාණ්ඩාගාර මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම් සමඟ පහත දක්වා ඇත.

2021 වර්ෂය සඳහා වෙන්කර ඇති මූල්‍ය ප්‍රතිපාදන

ප්‍රතිපාදන රු. මිලියන

		මූලධන වියදම්	පුනරාවර්තන වියදම්
වැඩසටහන **01**	**207 - 01 - 01**	13.000	281.650
වැඩසටහන **02**	**207 - 02 - 02**	248.900	971.650
		261.900	**1,253.300**
සමස්ත මූල්‍ය ප්‍රතිපාදන			**1,515.200**

2021 වර්ෂයට අදාලව සමාන්‍ය පරිපාලනය හා පුරාවිද්‍යා සේවය සඳහා වෙන්වූ මූල්‍ය ප්‍රතිපාදන සාරාංශය

මූලධන ප්‍රතිපාදන (අංශ අනුව ව්‍යාපෘති)

වැය ශීර්ෂය	වැඩ විස්තරය	රු.මිලියන	ව්‍යාපෘති ගණන
වැඩසටහන - **01** (සමාන්‍ය පරිපාලනය)			
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම		
207-01-01-2001	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	2.000	04
207-01-01-2002	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	1.000	
207-01-01-2003	වාහන	2.500	
	මූලධන වත්කම් අත්පත් කරගැනීම		
207-01-01-2102	ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ	3.000	
207-01-01-2103	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	3.500	
	හැකියා වර්ධනය		
207-01-01-2401	කාර්ය මණ්ඩල පුහුණු (කාර්ය මණ්ඩල බදවා ගැනීම්)	1.000	
	උප එකතුව	**13.000**	

වැඩසටහන - 02 (පුරාවිද්‍යා සේවය)			
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම			
207-02-02-2001	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	4.000	11
207-02-02-2002	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	0.400	
	මූලධන වත්කම් අත්පත් කරගැනීම		
207-02-02-2102	ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ	2.000	
207-02-02-2103	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	3.000	
	හැකියා වර්ධනය		
207-02-02-2401	කාර්ය මණ්ඩල පුහුණු (කාර්ය මණ්ඩල බඳවා ගැනීම්)	1.500	
	උප එකතුව	**10.900**	

207-02-02-05-2001	රජගලතැන්න පුරාවිද්‍යා ස්ථානය සංරක්ෂණය	2.000	31
207-02-02-05-2509	රජගලතැන්න පුරාවිද්‍යා ස්ථානය සංරක්ෂණය	51.000	
207-02-02-08-2509	පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක ගවේෂණය, කැණීම් හා පර්යේෂණ	**18.000**	**78**
	i. ගවේෂණ හා ලේඛන ගත කිරීම්	11.000	51
	ii. කැණීම්	6.000	10
	iii. අභිලේඛන හා නාණක විද්‍යා	1.000	17

207-02-02-09-2509	පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක සංරක්ෂණය සහ නඩත්තු කිරීම	**150.000**	**211**
	i. වාස්තුවිද්‍යා සංරක්ෂණ.	109.000	32
	ii. රසායන සංරක්ෂණ	4.880	32
	iii. නඩත්තු	36.120	147
207-02-02-10-2509	පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක ප්‍රවර්ධනය සහ මහජන ප්‍රදර්ශණය	**12.000**	**71**
	i. ප්‍රවර්ධන	7.900	33
	ii. මාධ්‍ය	0.600	01
	iii. කෞතුකාගාර	3.500	37
207-02-02-12-2509	රිටිගල පුරාවිද්‍යා ස්ථානය සංරක්ෂණය	**3.000**	**01**
207-02-02-15-2509	කන්නියා උණුවතුර ලිං නඩත්තුව (ත්‍රිකුණාමලය දිසාපති කාර්යාල මඟින් ක්‍රියාත්මක කරනු ලබයි)	**2.000**	**01**
	උප එකතුව	**238.000**	**393**
	මුළු එකතුව	**261.900**	**408**

පුනරාවර්තන වියදම් (නඩත්තු)

වැඩ සටහන 01 - සමාන්‍ය පරිපාලනය			
207-01-01-1303	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	3.000	4
වැඩ සටහන 02 - පුරාවිද්‍යා සේවය			
207-02-02-1303	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	6.500	15

....

ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා ගණන් දීමේ නිලධාරියා ආයතන ප්‍රධානියා

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ -එෆ්

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2020		සටහන	2020 (රු.) තත්‍ය	2019 (රු.)	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
	දේශීය භාණ්ඩ හා සේවා මත				
-	බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	ඒසීඒ-1
	බදු නොවන ආදායම් හා				
-	වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
	භාණ්ඩාගාර අග්‍රිම		1,014,420,000	996,184,000	ඒසීඒ-3
	තැන්පතු		94,058,993	150,480,060	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		2,870,797	1,574,034	ඒසීඒ-5/5(ඒ)
-	වෙනත් ලැබීම්		137,425,402	161,244,327	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		1,248,775,192	1,309,482,421	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		1,248,775,192	1,309,482,421	
	අඩුකළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්			-	ඒසීඒ-2(ii)
960,236,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	931,943,704	871,028,148	
78,512,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	66,708,894	85,536,274	

	සහනාධාර, ප්‍රදාන සහ				
2,112,000	මාරුකිරීම්	7	2,467,196	-	
5,952,000	පොළී ගෙවීම්	8	5,115,936	4,501,017	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9			
1,046.812,000	**මුළු පුනරාවර්තන වියදම් (ඇ)**		**1,006,235,731**	**961,065,439**	
	මූලධන වියදම්				
7,741,000	මූලධන වත්කම්	10	5,330,748	26,679,210	
	පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්				
5,635,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	2,825,786	8,184,353	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	ඒසිඒ-2(ii)
1,465,000	හැකියා වර්ධනය	14	66,920	2,431,451	
139,405,000	වෙනත් මූලධන වියදම්	15	80,664,737	48,794,308	
154,246,000	**මුළු මූලධන වියදම් (ඉ)**		**88,888,191**	**86,089,322**	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		**123,634,683**	**232,054,155**	
	තැන්පතු ගෙවීම්		**100,211,421**	**186,526,230**	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		**23,423,263**	**45,527,925**	ඒසිඒ-5/5(ඒ)
	මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)		**1,218,758,605**	**1,279,208,916**	
	2020 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)		**30,016,587**	**30,273,505**	

3.3. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ - පී

2020 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තක්‍ය 2020 (රු.)	2019 (රු.)
මූල්‍ය නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	ඒසිඒ-6	1,098,814,212	1,095,988,427
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5 ඒ	96,989,808	102,939,342
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	6,404,075	-
මුළු වත්කම්		**1,202,208,095**	**1,198,927,769**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		1,078,458	875,564
දේපළ පිරියත හා උපකරණ සංචිතය		1,098,814,212	1,095,988,427
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5 (බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	95,911,350	102,063,778
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	6,404,075	-
මුළු වගකීම්		**1,202,208,095**	**1,198,927,769**

පිටු අංක 01 සිට 33 දක්වා ඒසිඒ 2 සිට ඒසිඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 34 සිට 51 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත්, ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන දීමේ නිලධාරි

නුනුතුරු:
කේ.ඒ.ඩී.ආර්. නිශාන්ති ජයසිංහ
දිනය: ලේකම්
ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා
ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
4 වන මහල, "සෙත්සිරිපාය" - 11 අදියර
බත්තරමුල්ල.

.....
ගණන් දීමේ නිලධාරි
නම: මහාචාර්ය අනුර මහතුංගෙ
තනතුර: පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
දිනය: ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන නම:
ගණකාධිකාරි අංශය (මූල්‍ය)
කොමිසාරිස් (මූල්‍ය)
නම: ප්‍රධාන ගණකාධිකාරි
දිනය: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත
කොළඹ 07
2022.02.25

3.4. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තත්‍ය	
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්	2020	2019
මුළු බදු ලැබීම්	(රු.)	(රු.)
ගාස්තු, අධිහාර, දඩ මුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	137,425,402	161,244,327
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්		
අග්‍රිම ලැබීම්	1,014,420,000	996,184,000
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**1,151,845,402**	**1.157,428,327**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	1,006,235,731	961,065,438
සහනාධාර සහ මාරුකිරීම්	-	-
වෙනත් ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	23,612,512	31,273,506
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**1,029,848,243**	**992,338,944**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**121,997,159**	**165,089,383**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
අත්තිකාරම් අයකර ගැනීම්	2,870,797	1,574,034
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**2,870,797**	**1,574,034**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	88,888,190	85,089,322
අත්තිකාරම් ගෙවීම්	23,423,263	45,527,926
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**112,311,453**	**130,617,247**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**109,440,656**	**(129,043,213)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**12,556,502**	**36,046,170**

මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම	94,058,993	150,480,060
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**94,058,993**	**150,480,060**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	100,211,420	186,526,230
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**100,211,420**	**186,526,230**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**(6,152,427)**	**(36,046,170)**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)	**6,404,075**	නැත
ජනවාරි **01** දිනට ආරම්භක මුදල් ශේෂය	නැත	නැත
දෙසැම්බර් **31** දිනට අවසාන මුදල් ශේෂය	නැත	නැත
	6,404,075	

3.5. මූල්‍ය ප්‍රකාශ සටහන්

- මූල්‍ය ප්‍රකාශ සටහන් ඉදිරිපත් කර ඇත.

3.6. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව (රු.)		එකතු කරන ලද ආදායම (රු.)	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස

- අදාළ නොවේ.

3.7. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.)		තත්‍ය වියදම (රු.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	1,049,212,000	1,049,212,000	1,006,235,731	95%
ප්‍රාග්ධන	154,246,000	154,246,000	88,888,190	57%
මුළු එකතුව	**1,203,458,000**	**1,203,458,000**	**1,095,123,921**	**91%**

3.8 මු. රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේනතුවල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රතිපාදනය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලබා දුන් අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන (රු.)		තත්‍ය වියදම (රු.)	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ත්‍රිකුණාමලය	කන්නියා උණුවතුර ළිං පරිශ්‍රය නඩත්තු කිරීම	1,718,000	1,718,000	1,080,551	62%

3.9 මුල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2020 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු.)	31.12.2020 දිනට මුල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු.)	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය% ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	138,320,748	138,320,748	-	-
9152	යන්ත්‍රෝපකරණ	48,993,464	48,993,464	-	-
9153	ඉඩම	911,500,000	911,500,000	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විධාත්මක වත්කම				
9160	කෙරිගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.10. විගණකාධිපතිවරයාගේ වාර්තාව**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. CAS/C/DA/21/2020/FA
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2021 අගෝස්තු 19 දින

699 M/E
05 OCT 2021

අධ්‍යක්ෂ ජනරාල්,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව

යථෝක්ත විගණන වාර්තාව මේ සමඟ එවා ඇත.

02. ජාතික විගණන පනතේ 39(1) උප වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කර මෙම වාර්තාවේ දින සිට මාස 03 ක් ඇතුළත යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හෝ සැලැකිල්ලට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව මා වෙනද, භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත හා අදාළ අමාත්‍යවරයාට දැනුම් දිය යුතුය.

03. පනතේ 39(2) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාවේ ඇතුළත් මා විසින් පෙන්වා දී ඇති යම් ක්‍රියාමාර්ගයක් හෝ කරුණක් පිළිබඳව ක්‍රියාත්මක කිරීමේ හෝ නොහැකිවීමේ හේතු නිබෙනම් ඒ බවද මා වෙත දන්වා එවන මෙන් කාරුණිකව දන්වමි.

කේ.කේ.වී.ධර්මසිරි
අතිරේක විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පිටපත් 1. ලේකම්- ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

2. ලේකම්- මුදල් අමාත්‍යාංශය

ලැබුණා
18 OCT 2021
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } CAS/C/DA/21/2020/FA ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2021 අගෝස්තු 19 දින

අධ්‍යක්ෂ ජනරාල්
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වූ මෙම වාර්තාව නිකුත් කරනු ලබන අතර ගණන්දීමේ නිලධාරී විසින් ජාතික විගණන පනතේ 39 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කර මෙම වාර්තාවේ දින සිට මාස 03 ක් ඇතුළත යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හෝ සැලැකිල්ලට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව මා වෙත වාර්තා කළ යුතුය. මෙම වාර්තාවේ පෙන්වා දී ඇති යම් ක්‍රියාමාර්ගයක් හෝ කරුණක් පිළිබඳව ක්‍රියාත්මක කිරීමේ හෝ නොහැකිවීමේ හේතු තිබේනම් ඒ බවද මා වෙත දන්වා එවිය යුතුය.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) මූලධන වියදම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ) සමාලෝචිත වර්ෂයේ මූලධන වියදම් වැය විෂයයන් 18 ක් සඳහා මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.154,246,000 ක් වූ අතර, මුළු තත්‍ය වියදම් රු.88,888,190 ක් වූයෙන්, මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.65,357,810 ක ඉතිරියක් වූ අතර, එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 42 ක් විය. ඒ අනුව ප්‍රාග්ධන වැය සඳහා ලබාදී තිබූ ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කර නොතිබුණි.	ප්‍රාග්ධන වැය සඳහා ලබාදී ඇති ප්‍රතිපාදන එම මුදල් වෙන් කළ කාර්යයන් සඳහා භාවිතා කර අපේක්ෂිත ඉලක්ක ලභා කර ගැනීමට කටයුතු කළ යුතුවීම.	2020 වර්ෂය තුළ කොරෝනා රෝගය දිප ව්‍යාප්තව පැවතීම මත දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සඳහා සේවකයින් ප්‍රාදේශීයව යැවීමට (සංචරණ සීමා නිසා) අපහසුවීම මත ව්‍යාපෘති රාශියක් අපේක්ෂිත පරිදි ඉටු කිරීමට නොහැකි විය.
(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ, මූලධන වත්කම් අත්පත් කර ගැනීම් සඳහා මුළු වියදම් එකතුව රු.717,270 ක් වුවද, මූල්‍ය නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ එම වටිනාකම් රු.1,436,837 ක් ලෙස රු.719,567 ක් වැඩියෙන් සටහන් කර තිබුණි.	පිළිතුර ප්‍රකාරව නිවැරදි කළ යුතු වීම.	යන්ත්‍රෝපකරණ ලෙස මිලදිගත් රු.709,568 ක මුදලක් කාර්යාල උපකරණ ලෙස සටහන් වීම නිසා මෙම වෙනස ඇතිවිය. භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර නිවැරදි කරමි.

(ඇ)	මූල්‍ය ප්‍රකාශන අනුව යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, මූලධන වත්කම් අත්පත් කර ගැනීම් සඳහා මුළු වියදම රු.2,108,516 ක් වුවද, මූල්‍ය නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ එම වටිනාකම රු.1,388,948 ක් ලෙස, රු.719,568 ක් අඩුවෙන් සටහන් කර තිබුණි.	පිළිතුර ප්‍රකාරව නිවැරදි කළ යුතු වීම.	යන්ත්‍රෝපකරණ ලෙස මිලදීගත් රු.709,568 ක මුදලක් කාර්යාල උපකරණ ලෙස සටහන් වීම නිසා මෙම වෙනස ඇතිවිය. භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර නිවැරදි කරමි.
(ඈ)	වෙනත් මූලධන වියදම යටතේ විවිධ පාර්ශව වලින් ලැබී ගවේෂණ, කැණීම් සහ සංරක්ෂණ ව්‍යාපෘති සඳහා දරනු ලද එකතුව රු.80,664,737 ක් මූල්‍ය නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ ඇතුළත් කර නොතිබුණි.	විවිධ පාර්ශව වලින් විවිධ ව්‍යාපෘති සඳහා ලැබීම් මූල්‍ය නොවන වත්කම් සංචලන වාර්තාවේදී සටහන් කළ යුතු වීම.	කැණීම් මගින් අනාගම අවස්ථා වලදී පුරාවස්තු සොයා ගනු ලැබුවද, පුරාවස්තුවල මිල කළ නොහැකි වස්තූන් ලෙස සැලකේ. ඒ අනුව ඒවා මූල්‍ය නොවන වස්තූන් ලෙස සටහන් කබා නොමැත.

(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(i)	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසානයට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව රු.96,377,512 ක් වුවද, පාලන ගිණුමේ ශේෂය රු.96,989,808 ක් වූයෙන් රු.612,296 ක් වූ වෙනස වර්ෂ 05 කට වැඩි කාලයක සිට සැසඳුම් කර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	පිළිතුර ප්‍රකාරව මෙම වෙනස පරීක්ෂා කර නිරවුල් කළ යුතුවීම.	2020 දෙසැම්බර් 31 දිනට වෙනස රු.612,265.85 කි. මෙම වෙනස පරීක්ෂා කර නිරවුල් කිරීමට කටයුතු කරමි.

(ii)	දෙපාර්තමේන්තුවේ දැනට සේවයේ නොමැති සියයිය, විශ්‍රාම ගිය, සේවය හැර ගිය සහ වැඩ තහනම් කළ සේවකයින්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුළු හිඟ ණය ශේෂ එකතුව රු.5,289,100 ක් විය. එම විටිනාකමින් එකතුව රු.1,620,953 ක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට අයවිය යුතු ශේෂයන් වන අතර, එම ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	මෙම හිඟ ණය ශේෂ අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය.	මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී.

(ඇ) තැන්පතු

පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ දැනහස් දැක්වීම
(i) 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ ව්‍යාපෘති 92 ක කටයුතු වෙනුවෙන් ලැබුණු ප්‍රතිපාදන වලින් 2020 දෙසැම්බර් 31 දිනට ඉතිරි වූ ප්‍රතිපාදන එකතුව රු.27,260,458 ක් නිරවුල් කර නොතිබුණි.	නොරතුරු ලබාගෙන ක්‍රියාත්මක නොවන ව්‍යාපෘති සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂකවරුන්ගෙන් නොරතුරු ඉල්ලා ඇති අතර, නවදුරටත් ක්‍රියාත්මක නොවන ව්‍යාපෘති සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරමි.
(ii) පුරාවිද්‍යා ස්ථාන කැණීම්, සංරක්ෂණය, අළුත්වැඩියා ව්‍යාපෘති 14 ක් වෙනුවෙන් රජයේ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, පෞද්ගලික ආයතන, විදේශීය ආයතන වලින් ප්‍රධාන වශයෙන් 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලයේදී ලැබුණු අරමුදල් වලින් 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කර ඉතිරි මුදල් ශේෂ එකතුව	පිළිතුර ප්‍රකාරව ක්‍රියා කිරීම සුදුසු වේ.	නොරතුරු ඉල්ලා ඇති අතර, ලැබුණු පසු මුදල් රෙගුලාසි ප්‍රකාරව රජයේ ආදායමට බැර කරමි.

	රු.14,463,670 ක් නිරවුල් කර නොමැකිව තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි.	
(iii)	පුරාවිද්‍යාත්මක ස්ථාන වල ඉදිකිරීම් හා නඩත්තු කොන්ත්‍රාත් 17 ක ගෙවීම් වලින් 2020 දෙසැම්බර් 31 දිනට රඳවාගත් මුදල් රු.2,194,747 ක් නිරවුල් කිරීමට කටයුතු නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.	පිළිතුර ප්‍රකාරව ක්‍රියා කිරීම් සුදුසු වේ.	තොරතුරු ඉල්ලා ඇති අතර, ලැබුණු පසු මුදල් රෙගුලාසි ප්‍රකාරව රජයේ ආදායමට බැර කරමි.
(iv)	2020 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් පිළිබඳ ප්‍රකාශයේ අංක 6000-0-0-13-0-119 දරන තැන්පත් ගිණුමේ දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය, එදිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂයට වඩා රු.35,000 ක් වැඩියෙන් සටහන් කර තිබූ අතර, එදිනට අංක 6000-0-0-13-0-153 දරන තැන්පත් ගිණුමේ දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය එදිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂයට වඩා රු.35,000 ක් අඩුවෙන් සටහන් කර තිබුණි. මෙම වෙනස හඳුනාගෙන නිවැරදි කර නොතිබුණි.	මෙම පොදු තැන්පතු ගිණුම් ශේෂ නිවැරදි කිරීමට ක්‍රියා කළ යුතු වේ.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි.

(දෑ) දේපල පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ණයකරුගේ අදහස් දැක්වීම
දෙපාර්තමේන්තුවට අයත් ප්‍රවේණිගත වස්තු ලෙස, පෞරාණික ගොඩනැගිලි හා ස්මාරක, පුරාවිද්‍යාත්මක ස්ථාන, සංරක්ෂිත ප්‍රදේශ, ස්වාභාවික සම්පත් සහ කලාකෘතීන් අයත් වේ. මිල කළ නොහැකි ලෙස සඳහන් කර තිබුණත් ඒ පිළිබඳව ගිණුම්වල සටහන් නොමැති බව නිරීක්ෂණය විය.	මිල කළ නොහැකි වස්තු ලෙස සඳහන් කර තිබුණත් ඒ පිළිබඳව ගිණුම්වල සටහන් කිරීමට ක්‍රියා කළ යුතු වේ.	පුරාවස්තු වල අගය මිල කළ නොහැකි නිසා ස්මාරක සහ අනෙකුත් ප්‍රවේණිගත වස්තු වල වටිනාකම් මූල්‍ය ප්‍රකාශන වල සටහන් කිරීමට නොහැකි වී ඇත.

වටිනාකමක් ඇති මෙම වත්කම් පිළිබඳව පිළිගත් ගණකාධිකරණ මූලධර්මයන්ට සහ ගිණුම් ප්‍රතිපත්තියකට අනුව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමටත්, වර්ෂ ගණනාවක සිට හෞතික සමීක්ෂණයක් සිදු කර නොමැති මෙම වත්කම් පිළිබඳ හෞතික සමීක්ෂණයක් සිදු කිරීමටත් පියවරගෙන නොතිබුණි.

(ඉ) අග්‍රිම ගිණුම් ශේෂ

නිරීක්ෂණය	නිර්දේශය	දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම
2020 නොවැම්බර් 30 දිනැති අංක 06/2020 දරන භාණ්ඩාගාර මෙහෙයුම් මාර්ගෝපදේශය අනුව, 2020 දෙසැම්බර් 31 දිනට අක් මුදල් ගිණුම් පියවා මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතු වුවත්, එදිනට එකතුව රු.6,404,075 ක් වූ මුදල් පොතේ ශේෂය 2021 ජනවාරි 18 දින දක්වා දින ප්‍රමාදයකින් පසුව ප්‍රේෂණය කර තිබුණි.	චක්‍රලේඛය අනුව අග්‍රිමය පියවීමට ක්‍රියා කළ යුතු වේ.	නැන්පත් ගිණුමට අනපේක්ෂිත ලෙස දෙසැම්බර් මස ලැබුණු මුදල් වියදම් නොවීම මත මෙම මුදල් ඉතිරිවී ඇත.

(ඊ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	නිරීක්ෂණය වටිනාකම	අනුකූල නොවීම	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
		රු.			
(i)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ	-			
	• 11 වගන්තිය		ප්‍රාදේශිය කාර්යාල 10 ක 2020 වර්ෂයේදී භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර එම වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	මෙම චක්‍රලේඛය අනුව වාර්ෂික සමීක්ෂණ පවත්වා වාර්තා ඉදිරිපත් කළ යුතුය.	සමීක්ෂණයන් අවසන් කර වාර්තා කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.
	• 13.2 වගන්තිය	-	කෝට්ටේ පුරාවිද්‍යා කෞතුකාගාර පරිශ්‍රය තුළ දැබලන් වූ මෝටර් රථ 02 ක් සහ දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාල පරිශ්‍රය තුළ මෝටර් රථ 03 ක් සහ යතුරුපැදි 06 ක් චක්‍රලේඛය ප්‍රකාරව අපහරණය කිරීමකින් තොරව වර්ෂ ගණනාවක සිට දිරාපත් වෙමින් පැවතුණි.	මෙම චක්‍රලේඛය අනුව පරිහරණය කළ නොහැකි මෝටර් රථ අපහරණය කළ යුතුය.	මේ සඳහා විශේෂ කමිටුවක් පත් කර ඇති අතර, කඩිනමින් එම වාහන අපහරණය කිරීමට කටයුතු කරමි.
(ii)	2020 පෙබරවාරි 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 04	-	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම් සැසඳුම් වාර්තාව සඳහා ණයගැනි ලේඛන සහ ණයහිමි ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.	මෙම චක්‍රලේඛය අනුව ණයගැනි හා ණයහිමි ලේඛන පවත්වාගෙන යා යුතුය.	මෙම ලේඛන පවත්වාගෙන ගොස් ඇති බව සඳහන් කරමි.

2. මූල්‍ය සමාලෝචන

2.1. බැරකම් හා බැඳීම් වලට එළඹීම

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
පුනරාවර්ථන වැය විෂයයන් 08 කට අදාළව එම වැය විෂයයන් වල අයවැය ප්‍රතිපාදන වල ඉතිරිවීම් ඉක්මවා එකතුව රු.2,762,182 ක් බැරකම් වලට එළඹී තිබුණි.	ඇස්තමේන්තුගත ප්‍රතිපාදන සීමාව තුළ බැරකම් වලට එළඹීමට ක්‍රියා කල යුතු වීම.	දෙපාර්තමේන්තු වාහන ඉතා පැරණි වීමත්, වාර්ෂිකව ඉල්ලුම් කළ ප්‍රතිපාදන නොලැබීමක් මත මෙසේ ප්‍රධාන වශයෙන් බැරකම් වැඩි වී ඇත.

2.2. වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වීසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ) 2018 වර්ෂයේ සිටම නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මඟින් අනුමැතිය ගෙන අනුමත කරන ලද ඇස්තමේන්තු අනුව ව්‍යාපෘති කටයුතු ඉටුකර වියදම් වවුචර් මධ්‍යම සංස්කෘතික අරමුදල වෙත ඉදිරිපත් කර මුදල් ප්‍රතිපූරණය කරගෙන තිබුණි. නමුත්, 2019 සහ 2020 වර්ෂ වලදී එකතුව රු.38,064,351 ක් ව්‍යාපෘති සඳහා වැය කළද, එම මුදල් ප්‍රතිපූර්ණය කරන ලෙස මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් ඉල්ලීම් කර තිබුණද, මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකි වී තිබුණි.	මෙ ව්‍යාපෘති මඟින් සැලසුම් කළ කාර්යය අවසන්වව කරගෙන යාම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන රැස් කරගත යුතු වීම.	2019 දෙසැම්බර් 04 දින සිට 2020 දෙසැම්බර් 17 දක්වා ඉල්ලා සිටි මුදල් මේ වන තෙක් ලැබී නොමැත. එහි වටිනාකම රු.38,664,351 කි. මධ්‍යම සංස්කෘතික අරමුදලට ලැබෙන ආදායම් අඩුවීම මත බිල්පත් සියවීම සඳහා මුදල් නිදහස් කිරීම ප්‍රමාද වී ඇත.

(ආ) පාතියංගල ලෙන ව්‍යාපෘතිය සඳහා 2017 මැයි 02 දින එකතුව රු.5,002,431 ක මුදලක් මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් වෙන් කරගෙන තිබුණි. එම මුදල් වෙන් කළ කාර්යය සඳහා භාවිතා නොකර, 2020 ඔක්තෝබර් 09 දින ජර්නල් සටහනක් භාවිතා කර මධ්‍යම සංස්කෘතික අරමුදල් දායකත්වය යටතේ අරඹන ලද වෙනත් ව්‍යාපෘතිවල ද්‍රව්‍ය සැපයුම්කරුවන්ට ගෙවීම් සඳහා භාවිතා කර තිබුණි.	මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් වෙන් කළ මුදල් එම වෙන් කළ කාර්යය සඳහා භාවිතා කළ යුතු වීම.	මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් ලැබෙන මුදල් සංරක්ෂණ, කැණීම්, නඩත්තු කටයුතු වලට යොදවා ගැනීමට හැකියාව ඇති බැවින් එම කටයුතු සිදු කරන ලදී.
(ඇ) බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ 2020 පෙබරවාරි 24 දිනැති ලිපිය අනුව එකතුව රු.18,711,101 ක් වටිනා මධ්‍යම සංස්කෘතික අරමුදල් යොදාගෙන ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘති අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අනුමත කර තිබුණි. 2020 වර්ෂයේ එම ව්‍යාපෘති සඳහා භෞතික හා මූල්‍ය ඉලක්ක දැනුළන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඉදිරිපත් කරන ලෙස දන්වා තිබුණද, මෙම ව්‍යාපෘති සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.	මෙම ව්‍යාපෘති සඳහා වන ක්‍රියාකාරී සැලසුම් නියමිත පරිදි සකස් කළ යුතු වීම.	කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් කාර්යාල කටයුතු නිසි පරිදි ක්‍රියාත්මක නොවීම මත ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම අතපසුවී ඇත. මින් ඉදිරියේදී නිවැරදිව සකස් කරමි.
(ඈ) 2017 සිට 2022 කාල පරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කිරීමට ඇමරිකානු අරමුදල් දායකත්වය යටතේ රජගලනැන්න පුරාවිද්‍යා සංරක්ෂණ කාර්යයන් ආරම්භ කර ක්‍රියාත්මක කරමින් පැවතුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2020 වර්ෂයේදී රු.මිලියන 5.257 ක මූල්‍ය දායකත්වයක් ලැබී තිබුණත්, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව අතර සිදු කිරීමට තිබූ ගිවිසුම්ගත ක්‍රියාවලියේ පැවති ගැටළු සහගත තත්ත්වය	2022 වර්ෂයේ අවසන් කළ යුතුව පැවති මෙම ව්‍යාපෘති කටයුතු සැලසුම් කළ පරිදි ඒ ඒ වර්ෂවල සැලසුම් වලට අනුකූලව ඉටු කළ යුතු වීම.	කොරෝනා වසංගතය හේතුවෙන් හා රට වසා තැබීම් හේතුවෙන් අපේක්ෂිත පරිදි ව්‍යාපෘති නිම කිරීමට නොහැකි විය.

හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ අදාළ ව්‍යාපෘති කාර්යයන් ඉටු කර නොනිබුණි.		
(ඉ) කැළණිය රජමහ විහාරයේ බිතුසිතුවම් සහ මූර්ති සංරක්ෂණය සඳහා 2015 වර්ෂයේදී රාජ්‍ය සංස්ථාවක් මගින් රු.1,500,000 ක මුදලක් ලබාදී තිබුණි. 2020 වර්ෂය වන විට වර්ෂ ගණනාවක් ගතවී තිබුණද, කාර්යයන් ඉටු නිරීමකින් තොරව තැන්පතු ලෙජරයේ ඉදිරියට ගෙනවිත් තිබූ එකතුව රු.1,494,434 ක ශේෂය 2020 දෙසැම්බර් 11 දින රජයේ ආදායමට බැර කර තිබුණි.	බාහිර ආයතන මගින් ලැබූ මුදල්, අදාළ මුදල් ලබා දුන් කාර්යය සඳහාම භාවිතා කළ යුතු වීම.	රසායනාගාර අංශය මගින් පිළිතුරු කැඳවා ඇතත්, ලැබී නොමැති අතර, කැළණිය රජමහා විහාරයේ බිතුසිතුවම් හා මූර්ති සංරක්ෂණ කටයුතු වල යම් ප්‍රමාදයක් ඇති බව දැනුම් දෙමි.

2.3. බැංකු ගිණුම් මෙහෙයවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල ජංගම ගිණුමේ 2020 දෙසැම්බර් 31 දිනට එකතුව රු.1,426,091 ක් වූ නිකුත් කළ නමුත්, ඉදිරිපත් නොකළ චෙක්පත් 144 ක් විය. නමුත් 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල බැංකු ගිණුම් පිළිබඳ සටහන ප්‍රකාරව නිකුත් කළ නමුත් ඉදිරිපත් නොකළ චෙක්පත් පවතින බවට තොරතුරු සටහන් කර නොනිබුණි.	මෙම ඉදිරිපත් නොකළ චෙක්පත් පිළිබඳව විස්තර අදාළ සටහන තුළ සඳහන් කළ යුතුව තිබුණි.	පෞද්ගලික ලිපිනයන් සොයාගත නොහැකි වූ බැවින් මෙම චෙක්පත් පොදු නැන්පත් ගිණුමට බැර කරන ලදී. පසුව මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර රජයේ ආදායමට බැර කරමි.

(ආ) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල ඡංගම ගිණුමේ 2020 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් මුළු ලැබීම් එකතු වටිනාකම රු.8,220,803 ක් විය. එම ලැබීම් හඳුනාගෙන බැංකු සැසඳුම් නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කර නොකිබුණි. එම ලැබීම් වටිනාකමින් එකතුව රු.697,647 ක් වටිනා වෙක්පත් 78 ක් 2020 දෙසැම්බර් 31 දින හඳුනාගැනීමකින් තොරව පොදු කැන්පත් ලෙජරයට මාරු කර තිබුණි. එදිනට ඉතිරි ලැබීම්ද හඳුනාගෙන බැංකු සැසඳුම් නිවැරදි කිරීමට කටයුතු කර නොනිබුණි.	හඳුනා නොගත් සියලු ලැබීම් හඳුනාගෙන බැංකු සැසඳුම් නිවැරදිව සකස් කළ යුතු වීම.	2021 මාර්තු මස බැංකු සැසඳුම් සකස් කිරීමේදී මෙවා හඳුනාගෙන නිවැරදි කිරීම කරනු ඇත.
(ඇ) දෙපාර්තමේන්තුවේ අනුරාධපුර සහ මහනුවර ශාඛාවල පවතින බැංකු ඡංගම ගිණුම්වල 2020 දෙසැම්බර් 31 දිනට එකතුව රු.14,300 ක් වටිනා මාස 06 ඉක්මවූ නිරවුල් නොකළ වෙක්පත් පැවතුණි.	මෙම කාලය ඉකුත් වූ වෙක්පත් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියා කළ යුතුය.	මාස 06 ඉක්ම වූ වෙක්පත් සම්බන්ධව මුදල් රෙගුලාසි අනුව කටයුතු කරමි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. කාර්යය භාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ) දෙපාර්තමේන්තුවේ බස්නාහිර පළාත් කාර්යාලය යටතේ ඇති පානීයංගල ගල්ලෙන ආශ්‍රිත සංරක්ෂණ සහ කැණීම් කටයුතු 2012 වර්ෂයෙන් පසුව වසර 09 ක පමණ කාලයක් නතර කර දමා තිබුණි. විගණන අංශය සිදු කළ කෙෂ්ත්‍ර පරීක්ෂාවන් අනුව අක්කර 40 පමණ භූමි	පිළිතුර ප්‍රකාරව කාර්යය සම්පූර්ණ කිරීමක්, මැනීම් කටයුතු සිදු කර මායිම් කණු සිටුවීමත් ගවේෂණ වාර්තා නිකුත් කිරීමත් සිදු කළ යුතුව පවතී.	2021 වර්ෂයේ ඇස්තමේන්තු මාසයට පෙර මෙම සංවර්ධන කටයුතු සම්පූර්ණ කිරීමට සැලසුම් කර ඇත.

	ප්‍රදේශයක් අයත් මෙම ගල්ලෙන අවට මැනීම් කටයුතු සිදු කර මායිම් කණු සිටුවා නොතිබූ අතර, මෙම ගල්ලෙන සම්බන්ධව ගවේෂණය කර ගවේෂණ වාර්තාවක්ද නිකුත් කර නොතිබුණි.	
(ආ)	පොදු තැන්පත් සහ බාහිර ආයතන ආඥාර යටතේ 2020 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ සියළුම අංග මණින් ව්‍යාපෘති 28 ක් ක්‍රියාත්මක කර තිබුණි. එම ව්‍යාපෘති 28 න් ගවේෂණ හා ලේඛනගත කිරීම් අංශයන්, වාස්තු විද්‍යා සංරක්ෂණ අංශයන් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 02 ක් හැර ඉතිරි ව්‍යාපෘති 26 ම භෞතික ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණි.	2020 දී රට තුළ කොරෝනා රෝගය ව්‍යාප්ත වූවද, ප්‍රාදේශීයව බොහෝමයක් වැඩබිම් පැවතීම් නිසාත්, 2020 වර්ෂය තුළ ලභාකරගත් ප්‍රගතියට වැඩි ප්‍රගතියක් ලබා ගැනීමට හැකියාව තිබුණි.	රටේ පැවති කොරෝනා රෝග ව්‍යාප්තිය සහ නිරෝධායන නීති රීති හා සංචරණ සීමාවන් තුළ අපේක්ෂිත පරිදි ව්‍යාපෘති නිම කිරීමට නොහැකි විය.

3.2. ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
පුරාවිද්‍යා ස්ථාන සහ ස්මාරක සංරක්ෂණය හා ආරක්ෂා කිරීම සඳහා පිහිටුවා තිබූ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මාර්ග නඩත්තු කටයුත්තක් සඳහා පිටකෝට්ටේ හංදියේ ස්ථාපනය කර තිබූ ජුබිලි කණුව 2020 වර්ෂයේදී ගළවා ඉවත් කර තිබුණි. ක්‍රි.ව. 1887 වර්ෂයේ දී ස්ථාපනය කරනා ලද මෙම ස්මාරකය පිටකෝට්ටේ කොතුකාගාරයේ ලේඛනගත කිරීමකින්ද කොරව	පිළිතුර ප්‍රකාරව යළි ස්ථාපනය කිරීමට ක්‍රියා කළ යුතු වීම.	මෙම ජුබිලි කණුව තාවකාලිකව මාර්ග සංවර්ධන කටයුතු සඳහා ඉවත් කළ අතර, මාර්ග සංවර්ධන කටයුතු අවසන් බව මෙතෙක් දන්වා නොමැත. කෙසේ නමුත් ස්ථිරවම මෙය නැවත ජුබිලි කණුව මංසන්ධියේ ස්ථාපනය කිරීමට කටයුතු කරමි.

කැන්පත් කර තිබූ අතර, මාර්ග නඩත්තු කටයුතු අවසන් වුවද, එම ස්මාරකය නැවත ස්ථාපනය කිරීමට පියවරගෙන නොතිබුණි.

3.3. දේශීය අරමුදල් වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
ඓතිහාසික කෝට්ටේ රාජධානියට අයත් කොටු පවුර පාදා මතු කර ගැනීම, කැණීම් කටයුතු සිදු කිරීම, දිය අගල් ප්‍රදර්ශනා මට්ටමට පත්කිරීම යනාදිය කොටු බැමම සංරක්ෂණය කිරීමේ අරමුණු විය. අනවසර ඉදිකිරීම්, පස් සහ ගස්වැල් වලින් ප්‍රකාර බැමම වැසී ගොස් තිබූ අතර, වර්තමානය වන විට බැමමෙන් මීටර් 2000 පමණ සංරක්ෂණය කර තිබුණි. බැමම සංරක්ෂණය සඳහා 2020 වර්ෂයේදී ජාතික ප්‍රතිපත්ති හා ආගමික කටයුතු අමාත්‍යාංශය මඟින් රු.9,500,000 ක් වෙන් කර දී තිබුණද, දෙසැම්බර් 31 දිනට එකතුව රු.2,065,585 ක් වැය වීම නිසා එහි මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිවලින් සියයට 22 ක් සහ සියයට 55 ක් විය.	පිළිතුර ප්‍රකාරව කටයුතු කිරීම යෝග්‍ය වේ.	මෙනිදී දැඩි සංරක්ෂණ බාධාවන්ට මුහුණ දීමට සිදු විය. මෙම බැමම කැණීම් කර මතු කර ගෙන සංරක්ෂණය කළ යුතුය. මේ සඳහා කඹොක් ගල් සොයා ගැනීමද අපහසු විය. 2018 හා 2020 වර්ෂවල කාර්යය සාධනය උපරිම මට්ටමකට ලඟා කරගත නොහැකිවීම යන්න "ග්‍රාම වියදම් පොත" අනුවද සත්‍යයකි. ඉදිරියේදී මෙම කරුණුයන් මග හරවා ගැනීමට කටයුතු කරමි.

3.4. වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය මට්ටමේ කාර්ය භාරය ඉටු කිරීම සඳහා කලාප කාර්යාල පිහිටුවා තිබුණි. එම කලාප කාර්යාල බොහෝමයක් බෞද්ධ විහාරස්ථානයක හෝ පොදු ගොඩනැගිල්ලක ඉතා අවම කාර්යාල පහසුකම් මධ්‍යයේ පවත්වාගෙන යනු ලබන බව නිරීක්ෂණය විය. එම කාර්යාල වල සේවයේ නියුතු නිලධාරින්ට ප්‍රමාණවත් ඉඩකඩ හා අවම කාර්යාල පහසුකම් නොතිබූ ස්ථාන හඳුනාගෙන අවශ්‍ය පහසුකම් ලබාදීමට ඉහළ කළමනාකරණය පියවරගෙන නොතිබුණි.	දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල සහ කලාප කාර්යාලය සඳහා අවශ්‍ය කාර්යාල පහසුකම් ලබා දීමට ක්‍රියා කළ යුතුය.	මෙම කාර්යාලවල යටිතල පහසුකම් අවම මට්ටමක පවතී. විහාරස්ථානවල ඇති ඇතැම් කාර්යාල වෙනත් ස්ථානයකට ගෙන යාමේ අවශ්‍යතාවයක්ද පවතී. මෙම කාර්යාල සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමට කටයුතු කරමී.

3.5 විගණන විමසුම් වලට පිළිතුරු ලබා නොදීම

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
2020 වර්ෂයේ මූල්‍ය හා මූල්‍ය ප්‍රකාශන විගණන පරීක්ෂාවන් මත පදනම්ව නිකුත් කළ විගණන විමසුම් 02 ක් සඳහා ගණනදීමේ නිලධාරී විසින් පිළිතුරු ලබාදීමට කටයුතු කර නොතිබුණි.	විමසුම් සඳහා පිළිතුරු ලබා දීමට ක්‍රියා කළ යුතුය.	පිළිතුරු දී නොමැත.

3.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ) ජාතික වැදගත්කමක් සහිත ඉඩම් පුරාවිද්‍යා රක්ෂිත ලෙස ප්‍රකාශයට පත් කිරීමක්, එහි ආරක්ෂාව තහවුරු කර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් යෙදීමත් දෙපාර්තමේන්තුව සතු වැදගත් කාර්යභාරයක් විය. විගණන අංශය කළ පරීක්ෂා කිරීම් අනුව පසුගිය වර්ෂ 20 ක පමණ කාලය තුළ එවැනි ජාතික වැදගත්කමක් ඇති ඉඩම් 11 ක් පමණක් රක්ෂිත වශයෙන් ප්‍රකාශයට පත් කර තිබුණි.	පනතේ ප්‍රතිපාදන වලට අනුකූලව ජාතික වැදගත්කමක් ඇති ඉඩම් පුරාවිද්‍යා රක්ෂිත ලෙස ගැසට් කිරීමේ කාර්යය කඩිනමින් කළ යුතුවීම.	තහනම් ඉඩම් ප්‍රකාශයට පත් කිරීමේ වැඩපිළිවෙල ක්‍රියාත්මකව පවතින අතර, පසුගිය වසර 20 ක කාලය තුළ තහනම් ඉඩම් 11 ක් රක්ෂිත වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත.
(ආ) යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය සඳහා එම ජලාශයට යටවන භූමිය තුළ තිබූ පුරාවස්තු කැණීම් කර ඉවත් කර තිබූ අතර, ඒ පිළිබඳව සකස් කළ හානි ඇඟයුම් වාර්තාවට අනුව එම පුරාවස්තු ආරක්ෂිතව තැන්පත් කිරීම සඳහා කෞතුකාගාරයක් ඉදිකිරීමට යෝජනා කර ඒ සඳහා වන මූලික සැලසුම් හා ඇස්තමේන්තු ඉදිරිපත් කරන ලෙස පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත	මෙම කෞතුකාගාරය ඉදිකිරීමේ අවශ්‍යතාවය හා හැකියාව සොයා බලා ඒ අනුව ක්‍රියා කළ යුතු වේ.	පිළිතුරු ලබාදී නැත.

දැනුම් දී තිබුණි. මෙම කෞතුකාගාරය ඉදිකිරීමට අදාළ මූලික සැලසුම් හා ඇස්තමේන්තු සකස් නොකිරීම නිසා එම පුරාවස්තු අනාරක්ෂිත ලෙස පදවිය පුරාවිද්‍යා කලාප කාර්යාලය තුළ ගබඩා කර තිබුණි.

(ඇ)	දෙපාර්තමේන්තුව සතු වංචල පුරාවස්තු වන පෞරාණික කාසි විශාල ප්‍රමාණයක් ලේඛනගත කිරීමකින් තොරව අභිලේඛන, නානක විද්‍යා ඇශයේ රසායනාගාර අංශය තුළ සහ කලාප කාර්යාලවල ලේඛනගත කිරීමකින් තොරව පවතින බව නිරීක්ෂණය විය.	වංචල පුරාවස්තු හා කාසි කඩිනමින් ලේඛනගත කළ යුතු විය.	මෙම කාසි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට වසර ගණනාවක් තිස්සේ භාරදෙන ලද ඒවා වේ. ඒවා ඉදිරියේදී විධිමත්ව සංරක්ෂණය කර ලේඛනගත කිරීමට යෝජිතය. කළාප කාර්යාලවල ඇති කාසි ලේඛනගත කිරීමටද ඉදිරියේදී කටයුතු කරමි.
(ඈ)	දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය පිහිටි ප්‍රධාන ගොඩනැගිල්ලේ බිම් මහල ඵලදායී කාර්යයකට භාවිතා නොකර වසර ගණනාවක් තිස්සේ නිෂ්කාර්යව පැවතුණි.	දෙපාර්තමේන්තුවේ බිම් මහල ඵලදායී කාර්යයකට භාවිතා කිරීම අවශ්‍ය වේ.	පිළිතුරු ලබාදී නැත.

4. මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
2020 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ තනතුරු 84 කට අදාළව අනුමත කාර්ය මණ්ඩලය 4356 ක්ද, තත්‍ය කාර්ය මණ්ඩලය 1879 ක්ද විය. මේ අනුව පුරප්පාඩු සංඛ්‍යාව 2477 ක් විය. මෙම පුරප්පාඩු අතරින් විධායක මට්ටමේ පුරප්පාඩු 39 ක් පැවති අතර, ඒ සඳහා වැඩ ආවරණ මට්ටමින් පත්කර තිබුණි. මෙම පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට විවිධ බාධාවන් ඇති වී තිබූ අතර, සේවක පුරප්පාඩු පැවතීම නිසා අපේක්ෂිත කාර්ය භාරය ඉටු කර ගැනීමේ බාධාවන් ඇති වී තිබුණි.	බඳවා ගැනීම් පරිපාටිය හා පවත්නා නීති රීති අනුව මෙම සේවක පුරප්පාඩු අවශ්‍යතාව මත පදනම්ව කඩිනමින් සම්පූර්ණ කිරීමට ක්‍රියා කළ යුතුය.	නව තනතුරු 1940 ක් අනුමත වීම තනතුරුවල පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් ඇතිවීමට හේතු වී ඇත. මෙම තනතුරු පිරවීමට විවිධ බාධාවන් ඇති වී ඇති අතර, මෙම පුරප්පාඩු පිරවීමට අදාළ ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

කේ.කේ.වී.ධර්මසිරි
අතිරේක විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසාන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණනකාධිපති වාර්තාවේ පෙන්වා දී ඇති අඩුපාඩු නිවරදි කර ගැනීමට මේ වන විටත් ක්‍රියාත්මක වී ඇති අතර, ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇති නොවීමට කටයුතු කරන බව ද දන්වමි.

04. පරිච්ඡේදය

කාර්ය සාධන දර්ශකය

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශකය		අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම		
		100% - 90%	75% - 89%	50% - 74%
1	සංරක්ෂණය කරන ලද ගොඩනැගිලි ඒකක ගණන			√
2	ගවේෂණය කරන ලද පුරාවිද්‍යා ස්ථාන ගණන		√	
3	නඩත්තු කර පවත්වා ගෙන යන ස්ථාන සහ ස්මාරක වැඩ බිම් ඒකක ගණන			√

05.පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

රටේ සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් ආරක්ෂා කිරීම හා ආරක්ෂා කිරීමට දරණ උත්සහයන් ශක්තිමත් කිරීම.

ප්‍රධාන කාර්ය සාධක දර්ශක 03

1. සංරක්ෂණය කරන ලද ගොඩනැගිලි ඒකක ගණන.
2. ගවේෂණය කරක ලද පුරාවිද්‍යා ස්ථාන ගණන.
3. නඩත්තු කර පවත්වා ගෙන යන ස්ථාන සහ ස්මාරක වැඩ බිම් ඒකක ගණන.

ඉලක්කය	උපාය මාර්ගය / අරමුණු		ප්‍රධාන කාර්යය සාධක දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය.		
				100% - 90%	**75% - 89%**	**50% - 74%**
1. රටේ සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් ආරක්ෂා කිරීම හා ආරක්ෂා කිරීමට දරණ උත්සහයන් ශක්තිමත් කිරීම.	**1.1**	**විශ්වීය වැදගත්කමක් ඇති පුරාවිද්‍යා ස්ථාන ලෝක උරුම තත්ත්වයට උත්ශ්‍රේණි කිරීම.**				
	1.1.1	2030 වන විට පුරාවිද්‍යා ස්ථානයක් ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම.	ස්ථාන ගණන	මෙහි කටයුතු සිදු කරමින් පවතී		
	1.2	**පුරාවිද්‍යා ස්ථාන නියමු සැලසුම් තුළ හඳුනා ගෙන ඇති වැඩසටහන් තුළින් ප්‍රශස්ත මට්ටමට ගැනීම.**				
	1.2.1	නියමු සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම - (වර්ෂයකට 05)	පුරාවිද්‍යා ස්ථාන ගණන			√
	1.3	**ගවේෂණය කිරීම / ගැසට් කරනු ලබන පැරණි පුරාවිද්‍යා ස්මාරක සහ ස්ථාන වැඩි කිරීම**				
	1.3.1	ආරක්ෂිත ස්මාරක සහ රක්ෂිත ප්‍රකාශයට පත් කිරීම - (ආරක්ෂිත ස්මාරක වර්ෂයකට 100 / වෙන් කළ ප්‍රදේශ 25)	ආරක්ෂිත ස්මාරක සහ ස්ථාන ගණන			√
	1.4	**ප්‍රජාව, පාසැල් සහ විශ්වවිද්‍යාල ළමුන්ගේ සහභාගිත්වයෙන් ස්ථාන ආශ්‍රිත ක්‍රියාකාරකම් සංවිධානය කිරීම.** (වසරකට 15)	ස්ථාන ගණන			√
	1.5	**දෙස් විදෙස් ජනතාව දැණුවත් කිරීම සඳහා වැඩසටහන්.**	සංඛ්‍යාව	√		
	1.5.1	ජංගම ප්‍රදර්ශන පැවැත්වීම - (වසරකට 30)	ප්‍රදර්ශන සංඛ්‍යාව			

ඉලක්කය		උපාය මාර්ගය / අරමුණු	ප්‍රධාන කාර්යය සාධක දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය.		
				100% - 90%	75% - 89%	50% - 74%
1. රටේ සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් ආරක්ෂා කිරීම හා ආරක්ෂා කිරීමට දරණ උත්සහයන් ශක්තිමත් කිරීම.	1.5.2	ග්‍රන්ථ මුද්‍රණය - (වසරකට 10)	මුද්‍රණය කළ ග්‍රන්ථ සංඛ්‍යාව	√		
	1.5.3	දේශන පැවැත් වීම - (වසරකට 100)	පැවැත් වූ දේශන සංඛ්‍යාව			√
	1.5.4	විඩියෝ වැඩ සටහන් සකස් කිරීම (වසරකට 25)				
	1.5.5	සන්නිවේදන කටයුතු ප්‍රවර්ධනය.	වැඩ සටහන් සංඛ්‍යාව			
	1.5.6	පුස්තකාලවලට ග්‍රන්ථ මිලදී ගැනීම - (වසරකට 200)	මිලදී ගත් ග්‍රන්ථ සංඛ්‍යාව			√
	1.5.7	කෞතුකාගාර 28 ක් නඩත්තු කර පවත්වා ගෙන යාම.	කෞතුකාගාර සංඛ්‍යාව	√		
	1.5.8	සංචාරක මඟ පෙන්වන්නන්ගේ දැනුම වැඩිකිරීම.				
	1.6.	**පුරාවස්තු ස්ථාන හා ස්මාරක නඩත්තු කිරීම.** (වසරකට 200 පමණ)				
	1.6.1	පුරාවිද්‍යා ස්ථාන සහ ස්මාරක ආරක්ෂා කිරීම සහ ප්‍රදර්ශනාත්මක මට්ටමින් පවත්වා ගෙන යාම - කලාප 96 (වැඩබිම් 200 පමණ).	ආරක්ෂා කර නඩත්තු කරන ලද සහ ප්‍රතිසංස්කරණය කළ ස්මාරක ප්‍රමාණය		√	
	1.6.2	පුරාවිද්‍යා ස්මාරක නඩත්තු කිරීම - (වසරට 50)	ප්‍රතිසංස්කරණය කළ ස්මාරක ප්‍රමාණය		√	
	1.7	**පුරාවිද්‍යා පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.**				
	1.7.1	කැණීම් - (වසරකට 10)	ව්‍යාපෘති ගණන			√
	1.7.2	ක්ෂේත්‍ර ගවේෂණ හා ලේඛණගත කිරීම් - (වසරකට 20)	ව්‍යාපෘති ගණන		√	
	1.7.3	අභිලේඛණ හා නාණක විද්‍යා - (වසරකට 10)	ව්‍යාපෘති ගණන			√
	1.8	දෙපාර්තමේන්තු යටිතල පහසුකම් - (ස්ථාන, කළමනාකරණ, භෞතික සම්පත්, ගොඩනැගිලි, කාර්යාල මෙවලම්)				
	1.8.1	නව රසායනාගාර ඉදිකිරීම - (වසරකට 1)	ඉදිකළ රසායනාගාර සංඛ්‍යාව			

ඉලක්කය	උපාය මාර්ගය / අරමුණු		ප්‍රධාන කාර්යය සාධක දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය.		
				100% - 90%	75% - 89%	50% - 74%
1. රටේ සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් ආරක්ෂා කිරීම හා ආරක්ෂා කිරීමට දරණ උත්සහයන් ශක්තිමත් කිරීම.	1.8.2	නිල නිවාස 1 නඩත්තු කිරීම.	නඩත්තු කරන ලද නිල නිවාස සංඛ්‍යාව			√
	1.8.3	කාර්යාල ගබඩා පහසුකම් හා නව කලාප කාර්යාල ඉදිකිරීම - (වසරකට 3)	ඉදිකරන ලද කලාප කාර්යාල සංඛ්‍යාව			√
	1.8.4	වෙනත් - ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාල, සංචාරක බංගලා, කෞතුකාගාර අන්තර්ගතව ගොඩනැගිලි 100 ක් නඩත්තු කර පවත්වා ගෙන යාම.	නඩත්තු කරන ලද ගොඩනැගිලි සංඛ්‍යාව			√
	1.8.5	සියලුම සංචාරක බංගලා (15) සඳහා පහසුකම් සැපයීම.	සංචාරක බංගලා සංඛ්‍යාව		√	
	1.9	**පුරාවිද්‍යා ස්ථාන සහ ස්මාරක සංරක්ෂණය.**				
	1.9.1	වාස්තු විද්‍යා සංරක්ෂණ - (වසරකට 50)	සංරක්ෂණය කරන ලද ස්මාරක සංඛ්‍යාව			√
	1.9.2	රිටිගල පුරාවිද්‍යා ස්ථානය සංරක්ෂණය - (බන්දා පොකුණ)	සංරක්ෂණය කරන ලද ප්‍රතිශතය			√
	1.9.3	රසායන සංරක්ෂණ - (වසරකට 50)	සංරක්ෂණය කරන ලද ස්මාරක ප්‍රතිශතය			√
	1.9.4	රජගලතැන්න පුරාවිද්‍යා ස්ථානය සංරක්ෂණ ව්‍යාපාතිය.	සංරක්ෂණය කරන ලද ප්‍රතිශතය			√
	1.10	**පුරාවස්තු අඥාපනත සංශෝධනය කිරීම. (පුරාවස්තු අඥාපනත අවශ්‍ය අවස්ථාවන්හිදී සංශෝධනය කිරීමට කටයුතු කිරීම).**	පනතට සංශෝධන සිදු කරන ලද අවස්ථා ගණන	√		
	1.11	**පුරාවස්තු සඳහා ඩිජිටල් විශ්ව කෝෂය නිර්මාණය කිරීම.**				

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

2020 වර්ෂය අවසානය වන විට දිවයින පුරා ගැසට් මඟින් ප්‍රකාශයට පත්කර ඇති පුරාවිද්‍යා ස්මාරක 2,442 ක් පමණ ඇති අතර, තව දුරටත් හඳුනා නොගත් පුරාවිද්‍යා ස්ථාන සහ ස්මාරක සංඛ්‍යාව අති සංඛ්‍යාවක් විශාල පවති. 2020 වර්ෂය මුළුල්ලේම පැවති COVID -19 වසංගත තත්ත්වය මත සහ සීමිත සම්පත් සහ සීමිත නිලධාරි සහ සේවක පිරිස උපයෝගි කර ගනිමින් වුවද පුරාවිද්‍යා ස්ථාන සහ ස්මාරක හඳුනාගැනීම, ලේඛනගත කිරීම, සංරක්ෂණය හා වැඩිදියුණු කිරීම නඩත්තු කර පවත්වාගෙන යාම සහ මහජන ප්‍රදර්ශන කටයුතු යම් ප්‍රමාණයකට හෝ සාර්ථකව සිදු කරන ලදි. තවද, පුරාවස්තුවල ආරක්ෂාව තහවුරු කෙරෙන පුරාවිද්‍යා පනතෙහි සඳහන් පුරාවස්තු විනාශය සම්බන්ධව ඇති දඩුවම් සහ දඩමුදල් වැඩි කරමින් පනත සංශෝධනයට අදාළ කටයුතුද බොහෝ දුරට අවසන් කරන ලදි. පුරාවස්තු විනාශ කරන්නන් සම්බන්ධව 862 ක් පමණ අත් අඩංගුවට පත්ව ඇති අතර, අය කර ගන්නා ලද දඩ මුදල රු.මි. 16.804 ක් පමණ වේ.

මෙහිදී අභියෝග ලෙස සීමිත මූල්‍ය සහ භෞතික සම්පත්, නිලධාරි /සේවක හිඟය සහ ප්‍රමාණවත් වාහන සංඛ්‍යාවක් දෙපාර්තමේන්තුව සතු නොවීමත් 2020 වර්ෂයේ මුළුල්ලේ පැවති COVID වසන්ගත තත්ත්වය හමුවේ සංවර්ධන වැඩසටහන් සක්‍රීයව සිදු කිරීමට උත්සහ කිරීම මුලික වේ.

06.පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය 2020.12.31 දිනට

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත) **
ජ්‍යෙෂ්ඨ	54	15	39
තෘතීයික	56	24	32
ද්විතියික*	812	574	188
ප්‍රාථමික**	3,434	1,266	2,158

6.2. ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපානු ලැබ ඇති ආකාරය.

* තනතුරු 232 ක් විශ්‍රාම යාමෙන් පසු අහෝසි වේ.

** තනතුරු 20 ක් විශ්‍රාම යාමෙන් පසු යටපත් වේ.

PL – 01 ශ්‍රේණියේ නව තනතුරු 1,865 ක් අනුමත වීම හේතුවෙන් පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් පෙන්නුම් කෙරේ. මෙම තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කළද එම කටයුතු අත්හිටුවා ඇත. ඉදිරියේදී බහු කාර්ය සංවර්ධන කාර්ය සාධන බලකා දෙපාර්තමේන්තුව මඟින් පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ.

කෙසේ වුවද ඒක් ඒක් සේවා ගණයන්හි පුරප්පාඩු හේතුවෙන් ඇතිව ඇති සේවා අවශ්‍යතාව පහළ ශ්‍රේණි මඟින් හෝ ආවරණය කර ගනිමින් ඉලක්කගත සැලසුම් ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි.

6.3 මානව සම්පත් සංවර්ධනය

දේශීය පුහුණු - 2020

අනු අංකය	පුහුණු වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කලසීමාව	සමස්ථ ආයෝජනය (රුපියල්)	නිමැවුම / ලබාගත් දැනුම
1	පාසැල් සිසුන් / භික්ෂූණ් වහන්සේලා/ ග්‍රාම නිලධාරින් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව දෙපාර්තමේන්තු නිලධාරින් දැනුවත් කිරීමේ වැඩසටහන.	42	2020.08.28 දින	14,100.00	පාසැල් සිසුන් /භික්ෂූණ් වහන්සේලා / මහජනතාවට පුරාවිද්‍යා උරුමය රැක ගැනීම පිළිබඳව දේශන පවත්වන ආකාරය පිළිබඳව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ දේශන පවත්වන ලද නිලධාරීන් දේශන සිදු කරන ආකාරය පිළිබඳ අවබොධයක් ලබා ගැනීම.

* **ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වීම.**

- ශාස්ත්‍රීය කටයුතු ඉටු කරන දෙපාර්තමේන්තුවක් වශයෙන් එම ශාස්ත්‍රීය දැණුම යාවත්කාලීන කිරීම අවශ්‍ය වන බැවින් දේශීය හා විදේශීය පුහුණු ලබා දීම අවශ්‍ය වේ. තවද කාර්ය පරිපාටික රීති, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි වැනි කාර්යාල ක්‍රමවේදයන් පිලිබඳවද, සේවක දැනුම අල්ප බැවින් ඒ සම්බන්ධවද පුහුණුව ලබා දිය යුතුව ඇත. රාජකාරී කාර්යක්ෂමතාවය වර්ධනය සඳහා ආකල්පමය වෙනසක් නිරන්තරයෙන් ගොඩනැගිය යුතු බැවින් ආකල්ප සංවර්ධනාත්මක වැඩසටහන්ද සිදු කළ යුතුය.

07.පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
1	**පහත සඳහන් මුල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1.	වාර්ෂික මුල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2.	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3.	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-		
1.4.	ගබඩා අත්තිකාරම් ගිණුම්	-		
1.5.	විශේෂ අත්තිකාරම් ගිණුම්	-		
1.6.	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.2.	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත් කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.3.	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.4.	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.5.	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
2.6.	වෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.7.	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.8.	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.9.	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.10.	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
2.11.	උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
3	**මුල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම. (මු.රෙ. 135)**			
3.1.	මුල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී නිබීම.	අනුකූල වේ		
3.2.	මුල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ		
3.3.	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී නිබීම.	අනුකූල වේ		
3.4.	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම.**			
4.1.	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ (වාර්ෂික හා කාර්තුමය වශයෙන් සකස් කිරීම)		
4.2.	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.3.	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.4.	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
4.5.	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1.	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබාදී තිබීම.	අනුකූල නොවේ	බොහෝ අවස්ථාවලදී නියමිත දිනට පිළිතුරු ඉදිරිපත් ව නොමැත.	

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
6	**අභ්‍යන්තර විගණනය**			
6.1.	මු.රෙ. 134(2) DMA/1 - 2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
6.2.	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම.	අනුකූල නොවේ	විගණන වාර්තා සඳහා පිළිතුරු සැපයීමේ ප්‍රමාදයක් දක්නට ඇත.	
6.3.	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
6.4.	මුදල් රෙගුලාසි 134(4) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1.	DMA චක්‍රලේඛ 1 - 2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුල පවත්වාගෙන තිබීම.	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1.	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණ කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.2.	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙක් පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
8.3.	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ (එහෙත් කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් නියමිත දිනයේදී සිදු කිරීමට නොහැකි විය.)		
8.4.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම.	අනුකූල වේ එහෙත් කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් නියමිත දිනයේදී සිදු කිරීමට නොහැකි විය.)		
8.5.	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම.	-		
9	**වාහන කළමනාකරණය**			
9.1.	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
9.2.	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම.	අනුකූල වේ		
9.3.	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
9.4.	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		
9.5.	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ		
9.6.	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1.	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය නිරණ ක්‍රියා මාර්ග
10.2.	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
10.3.	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1.	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2.	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදන උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට ඵලඹීම.	-		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1.	සීමාවන් වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2.	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ		
12.3.	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ (එහෙත් සේවය අතහැර ගිය හා සේවයෙන් පහකළ නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගනිමින් පවති.		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1.	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2.	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1.	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ		
14.2.	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
14.3.	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		
14.4.	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1.	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ		
15.2.	රැස් කර තිබූ ආදායම්, නැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ		
15.3.	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1.	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුල කාර්ය මණ්ඩලය පවත්වාගෙනයාම.	අනුකූල වේ		
16.2.	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල වේ		
16.3.	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම.**			
17.1.	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2.	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ		
17.3.	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1.	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ		
18.2.	එම චක්‍රලේඛයේ 2.3. ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.**			
19.1.	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2.	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ		
19.3.	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		
19.4.	ඉහත චක්‍රලේඛයේ 6.5. ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල නොවේ	අදාල අංශ ප්‍රධානියාට වගකීම් පවරා ඇත.	
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම.**			
20.1.	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල නොවේ	80% පමණ නිවරදි කර ඇත.	